# 06 ශ්‍රේණිය - ගණිතය

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පොත අංක-04

## (2020- නව නිර්දේශය)




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


(විවිධ පළාත් සහ පාසල් මගින් තුන්වන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 05ක් සහ පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)


Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# Grade 6 Maths 3rd term Online Class Paper No - 06

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education**

තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය
**Third Term Test - Grade 06**


නම/විභාග අංකය : ........................................... ගණිතය කාලය: පැය 02 යි.

## I - කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

1) $16 : 12 = 4 : \square$ හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න.

2) $2457481376$ සම්මත ආකාරයෙන් ලියන්න.

3)  අඳුරුකර ඇති කොටස මුළු රූපයේ භාගයක් ලෙස ලියන්න.


4) $3.5 + 2.03$ අගය සොයන්න.

5) ත්‍රිකෝණ සංඛ්‍යාවක් නිරූපණය කිරීමට ඇඳ ඇති අසම්පූර්ණ රටාවක් රූපයේ දැක්වේ. එය සම්පූර්ණ කර ත්‍රිකෝණ සංඛ්‍යාව ලියන්න.

.........................

.........................

.........................



6) රාජේන්ද්‍ර සතුව වෙරළු ගෙඩි 24 ක් ඇත. මෙම වෙරළු ගෙඩි 24 සමානව ගොඩවල් වලට වෙන් කල හැකි ආකාර 2 ක් ලියන්න.


7) $32 = \square^{5}$ හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න.

8) $37 \div 3$ සුළුකර ලබ්ධිය හා ශේෂය ලියන්න.

9) $>$ සහ $<$ යන අසමානතා ලකුණු වලින් හිස්තැනට ගැලපෙන ලකුණ යොදන්න.

$-5 \ldots\ldots\ldots -7$

10) $a$ හා $b$ අක්ෂර වලින් දක්වා ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි සඳහන් කරන්න.




$a$ ....................................................................

$b$ ....................................................................


11) පහත වගන්තියෙන් දැක්වෙන්නේ නියතයක්ද නැතහොත් විචල්‍යයක්ද?

අඹ පොකුරක ඇති අඹ ගෙඩි ගණන

12) සම්මුඛ පාද යුගල එකම පරතරයකින් පිහිටි, සියළුම පාද දිගින් සමාන වූ හා සියළුම ශීර්ෂ කෝණ සෘජු කෝණ වූ චතුරස්‍රය හැඳින්විය හැකි නම කුමක්ද?

13) චිත්‍ර ප්‍රස්තාරයක් මගින් දත්ත නිරූපණයේදී  යන සංකේතය මගින් 100 ක් නිරූපණය කෙරේ නම් 75 ඉහත සංකේතය මගින් නිරූපණය කරන ආකාරය ඇඳ පෙන්වන්න.


14) තරාදියක වම් පස තැටියට $1kg$ ක පඩියක්ද ,දකුණු පස තැටියට සමාන ස්කන්ධ ඇති පාර්සල් 4 ක් ද දැමූ විට තරාදිය සමබරව පිහිටයි නම් එක් පාර්සලයක ස්කන්ධය ගණනය කරන්න.





15) බෝතලයක ජලය $3.065l$ (ලීටර්) ක ප්‍රමාණයක් ඇත. එම ජල ප්‍රමාණය $l$ (ලීටර්) හා $ml$ (මිලි ලීටර්) වලින් ප්‍රකාශ කරන්න.

ලීටර් ................ මිලි ලීටර් ...............

16) සමචතුරස්‍රාකාර කුඩා කොටුවක පැත්තක දිග $1cm$ (සෙන්ටිමීටර්) නම් අඳුරුකර ඇති රූපයේ පරිමිතිය සොයන්න.




17) රූපයේ දී ඇති තොරතුරු අනුව වෘත්තය මත පිහිටි ලක්ෂ 2 ට අදාළ ඉංග්‍රිසි අක්ෂර ලියන්න.




18) 5 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවක එකස්ථානයේ තිබිය හැකි ඉලක්කම් මොනවාද?

19) ශිෂ්‍යයෙක් සමාන දිගින් යුතු ඉරටු 6 ක් හා ක්ලේ ගුලි (මැටි ) 4ක් භාවිතා කරමින් සකස්කල සැකිල්ලක ආකෘතියක් රූපයේ දැක්වේ. මෙම සැකිල්ලේ කඩදාසි ඇලවීමෙන් පසු ඔහුට සාදාගත හැකි ඝන වස්තුව කුමක්ද?



20)

| | | | | | |
|---|---|---|---|---|---|
| $\frac{1}{3}$ | $\frac{7}{9}$ | $\frac{1}{50}$ | $\frac{7}{5}$ | $\frac{4}{11}$ | $\frac{1}{13}$ |

ඉහත කොටුව තුළ දැක්වෙන භාග සංඛ්‍යාවල ඇති පොදු ලක්ෂණ පදනම් කරගෙන කාණ්ඩ 2 කට වෙන්කර පහත සංවෘත රූප තුළ ලියන්න.

## ගණිතය - II කොටස

❖ **පළමු ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**

1). a). i. $5:7$ අනුපාතය කියවන ආකාරය ලියන්න. (ල 01)

ii. පහත දී ඇති වගන්ති වලින් අනුපාත දැක්වෙන වගන්ති ඉදිරියෙන් $(\surd)$ ලකුණද , අනුපාතික දැක්වෙන වගන්ති ඉදිරියෙන් $(\times)$ ලකුණද යොදන්න.

- මලිත්ගේ වයස අවුරුදු 8 ක් ද ගනේෂ්ගේ වයස අවුරුදු 12 ක් ද වේ. ( )
- සෘජුකෝණාස්‍රාකාර මල් පාත්තියක දිග $3m$ ක් ද පළල $1\frac{1}{2}m$ ක් ද වේ. ( )
- තේ කෝප්පයක් සඳහා සීනි හැඳි 2 ක් අවශ්‍යය වේ. ( ) (ල 03)

iii. ලණු කැබලි දෙකක දිග පිළිවෙලින් $1m$ හා $250cm$ කී. එම දිග අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න. (ල 02)

vi. $5:2$ අනුපාතයට තුල්‍ය අනුපාතයක් ලියන්න. (ල 01)

b). බේකරි නිෂ්පාදනයක් සඳහා පිටි $15kg$ කට සීනි $5kg$ ක් මිශ්‍ර කල යුතුය.

**i.** බේකරි නිෂ්පාදනයට ගන්නා පිටි හා සීනි අතර අනුපාතය සොයන්න. (ල 02)

ii. මෙම මිශ්‍රණයේ සීනි $1kg$ කට මිශ්‍ර කල යුතු පිටි ස්කන්ධය සොයන්න. (ල 01)

iii. මිශ්‍රණයේ $60kg$ ක ඇති සීනි ස්කන්ධය සොයන්න. (ල 03)

C ). ඇමරිකා එක්සත් ජනපදයේ සේවය කරන නිමේෂ්ගේ මාසික වැටුප ඇමෙරිකානු ඩොලර් 800 කි. එම මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් ගණනය කරන්න.

( ඇමෙරිකානු ඩොලර් 1ක් ශ්‍රී ලංකා රුපියල් 165 කි. ) (ල 03)

2). a) පාතිමා සතුව තිබූ රු.100 කින් රු. $a$ ප්‍රමාණයක් නිමාලිට දුන්නාය.

i. පාතිමා ලඟ ඉතිරි මුදල සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. (ල 02)

ii. නිමාලිට දුන් මුදල රු. 45 ක් නම් පාතිමාට ඉතිරිවන මුදල ඉහත ගොඩනැගූ වීජීය ප්‍රකාශනය ඇසුරින් සොයන්න. (ල 02)

iii. පාතිමා සතුව තිබූ රු.100 න් පාතිමාට ඉතිරිවන මුදල රු. 75.00ක් වීමට නම් නිමාලිට දිය යුතු මුදල සොයන්න. (ල 02)

b ). i. $3 \times 3 \times 3 \times 3$ දර්ශක ආකාරයෙන් ලියන්න. (ල 01)

ii. $2^3 \times 3^2$ අගය සොයන්න. (ල 03)

iii. $<$ හෝ $>$ හෝ $=$ යන සංකේත වලින් ගැලපෙන සංකේතය හිස්තැනට යොදන්න. (ල 01)

$4^2$____$3^2$

3). a ). රෝහලක එක් දිනක ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි 60 දෙනෙකුගේ රෝග පිළිබඳ තොරතුරු ඇතුලත් වගුවක් පහත දැක්වේ.

i. එහි හිස්තැන් පුරවන්න.

| රෝගය | ප්‍රගණන ලකුණු | සංඛ්‍යාව |
|---|---|---|
| උණ | 𝍸 𝍸 /// | 13 |
| අක්ෂි ආබාධ | 𝍸 𝍸 𝍸 //// | ................. |
| දියවැඩියාව | ............................ | 16 |
| අධි රුධිර පීඩනය | 𝍸 //// | 9 |
| වකුගඩු රෝගය | ............................ | ................. |

(ල 05)

ii. වැඩිම රෝගීන් සංඛ්‍යාවක් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණ සිටියේ කුමන රෝගය සඳහාද? (ල 02)

b). ඉහත වගුවේ තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක් මගින් පහත පරිදී නිරූපනය කර ඇත.

i. නිරූපනය කර ඇති තොරතුරු අනුව  රූපයෙන් නිරූපනය කර ඇති රෝගීන් සංඛ්‍යාව කීයද? (ල 01)

ii. ඒ අනුව පහත චිත්‍ර ප්‍රස්තාරයේ හිස්තැන් පුරවන්න.

| | |
|---|---|
| උණ |  |
| අක්ෂි ආබාධ | ............................................................. |
| දියවැඩියාව |  |
| අධි රුධිර පීඩනය | ............................................................. |
| වකුගඩු රෝගය | ............................................................. |

(ල 03)

4). a ). සම්පූර්ණයෙන් හිස්ව ඇති ජල ටැංකියකට $A$ හා $B$ නැමැති නල දෙකකින් ජලය සපයනු ලැබේ. $C$ නැමති නලයෙන් ජලය ඉවත්වේ.


- $A -$ නලයෙන් මිනිත්තු 15 ක දී ජලය $250l\ 750ml$ ක්ද, $B -$ නලයෙන් මිනිත්තු 15 ක දී ජලය $249l\ 500ml$ ක්ද ටැංකියට එකතුවේ.
- $C -$ නලයෙන් මිනිත්තු 15 ක දී ජලය $200l\ 500ml$ ක් ටැංකියෙන් ඉවත්වේ.

i. $C$ නලය වසා $A$ හා $B$ නල දෙක පමණක් මිනිත්තු 15 ක කාලයක් විවෘතව තැබුව හොත් ටැංකියට එකතුවන ජල ප්‍රමාණය සොයන්න. (ල 02)

ii. මිනිත්තු 15 ක කාලයකදී $B$ නලයට වඩා , $A$ නලයෙන් කොපමණ ජල ප්‍රමාණයක් ටැංකියට එකතුවේද? (ල 02)

iii. $A, B$ හා $C$ නල තුනම මිනිත්තු 15 ක කාලයක් විවෘතව තැබුවහොත් මිනිත්තු 15 අවසානයේ ටැංකියේ ඇති ජල ප්‍රමාණය සොයන්න. (ල 03)


b). $X$ හා $Y$ යනු පතුලේ ප්‍රමාණය සමාන වූ උසින් පමණක් වෙනස් වූ භාජන දෙකකි.




i. කුඩා භාජනයේ ධාරිතාවය ලීටර් කීයද? (ල 02)


ii. කුඩා භාජනය සම්පූර්ණයෙන් පුරවා විශාල භාජනය ජලයෙන් පිරවූයේ නම් වාර කීයකදී විශාල භාජනය පිරවිය හැකිදැයි නිමානය කරන්න. (ල 02)

5) i. පහත තල රූප අතරින් සරළ රේඛීය තල රූප තෝරා තිත් ඉර මත රූපයේ අක්ෂරය ලියන්න.




සරල රේඛීය තල රූප ............................................................ (ල 04)

ශිෂ්‍යයෙක් කොටු කඩදාසියක සරළ රේඛීය තල රූප ඇසුරින් කරන ලද නිර්මාණයක් පහත දැක්වේ.




ii. $A, B, C$ ලෙස තද කළු සරල රේඛීය මායිම් වලින් වටවූ රූපවල නම් දී ඇති අක්ෂර ඉදිරියෙන් ලියන්න.

$A$ – ......................................

$B$ – ......................................

$C$ – ......................................

(ල 03)

iii. කොටු කඩදාසියේ එක් කොටුවකින් නිරූපිත වර්ගඵලය වර්ග සෙන්ටි මීටර් එකක් $(1cm^2)$ නම් ඉහත රූපයේ වර්ගඵලය වර්ග සෙන්ටි මීටර් වලින් සොයන්න. (ල 04)

6). a). හිස්තැන් පුරවන්න.

i. $\frac{2}{5} \times \frac{\square}{2} = \frac{\square}{10}$ (ල 02)

$<$ හෝ $>$ යන සංකේත වලින් ගැලපෙන සංකේතය හිස්තැනට යොදන්න.

ii. $\frac{5}{7} \dots\dots\dots \frac{5}{9}$ (ල 01)

iii. $\frac{5}{7} \dots\dots\dots \frac{9}{14}$ (ල 01)

iv. $\frac{5}{7}, \frac{5}{9}, \frac{9}{14}$ අවරෝහණ පිළිවෙලට සකස් කරන්න. (ල 02)

b). වෙළෙන්දෙක් අඹ තොගයකින් $\frac{1}{2}$ පළමු දිනයේ ද, $\frac{3}{8}$ දෙවන දිනයේ ද විකුණන ලදී.

i. පළමු දිනයේ හා දෙවන දිනයේ විකුණු අඹ තොගය මුළු අඹ තොගයේ භාගයක් ලෙස දක්වන්න. (ල 03)

ii. දෙවන දිනයට වඩා පළමු දිනයේ විකුණු අඹ ප්‍රමාණය මුළු අඹ තොගයේ භාගයක් ලෙස දක්වන්න. (ල 02)

# Grade 6 Maths 3rd term Online Class Paper No - 06

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education**

**Answer**

තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය
**Third Term Test - Grade 06**

නම/විභාග අංකය : .............................................. ගණිතය කාලය: පැය 02 යි.


## I - කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

1) $16 : 12 = 4 :$ [ 3 ] හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න. ———— (2)

2) 2457481376 සම්මත ආකාරයෙන් ලියන්න.

2 457 481 376 ———— (2)

3) 

අඳුරුකර ඇති කොටස මුළු රූපයේ භාගයක් ලෙස ලියන්න.


$\frac{7}{20}$ ———— (2)

4) $3.5 + 2.03$ අගය සොයන්න.

5.53 ———— (2)

5) ත්‍රිකෝණ සංඛ්‍යාවක් නිරූපණය කිරීමට ඇඳ ඇති අසම්පූර්ණ රටාවක් රූපයේ දැක්වේ. එය සම්පූර්ණ කර ත්‍රිකෝණ සංඛ්‍යාව ලියන්න.

15 ———— (1)



———— (1)

6) රාජේන්ද්‍ර සතුව වෙරළු ගෙඩි 24 ක් ඇත. මෙම වෙරළු ගෙඩි 24 සමානව ගොඩවල් වලට වෙන් කල හැකි ආකාර 2 ක් ලියන්න.

12, 12

8, 8, 8 හෝ නිවැරදි ආකාර 2ක්. ——— (2)

7) $32 = \boxed{2}^5$ හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න. ——— (2)

8) $37 \div 3$ සුළුකර ලබ්ධිය හා ශේෂය ලියන්න.

```
   12
3 |37
   3
    7
    6
    1
```


ලබ්ධිය – 12 ——— (1)

ශේෂය – 1 ——— (1)

9) $>$ සහ $<$ යන අසමානතා ලකුණු වලින් හිස්තැනට ගැලපෙන ලකුණ යොදන්න.

$-5 \ldots > \ldots -7$

10) $a$ හා $b$ අක්ෂර වලින් දක්වා ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි සඳහන් කරන්න.




$a$ ..........පරාවර්ත.......... ——— (1)

$b$ ..........සුළු.......... ——— (1)


11) පහත වගන්තියෙන් දැක්වෙන්නේ නියතයක්ද නැතහොත් විචල්‍යයක්ද?

අඹ පොකුරක ඇති අඹ ගෙඩි ගණන – විචල්‍යයක්. ——— (2)


12) සම්මුඛ පාද යුගල එකම පරතරයකින් පිහිටි, සියළුම පාද දිගින් සමාන වූ හා සියළුම ශීර්ෂ කෝණ සෘජු කෝණ වූ චතුරස්‍රය හැඳින්විය හැකි නම කුමක්ද?

සමචතුරස්‍රය. ——— (2)

13) චිත්‍ර ප්‍රස්තාරයක් මගින් දත්ත නිරූපණයේදී  යන සංකේතය මගින් 100 ක් නිරූපණය කෙරේ නම් 75 ඉහත සංකේතය මගින් නිරූපණය කරන ආකාරය ඇඳ පෙන්වන්න.

 ——— (2)

14) තරාදියක වම් පස තැටියට $1kg$ ක පඩියක්ද ,දකුණු පස තැටියට සමාන ස්කන්ධ ඇති පාර්සල් 4 ක් ද දැමූ විට තරාදිය සමබරව පිහිටයි නම් එක් පාර්සලයක ස්කන්ධය ගණනය කරන්න.





$250g$ ———— (2)

15) බෝතලයක ජලය $3.065l$ (ලීටර්) ක ප්‍රමාණයක් ඇත. එම ජල ප්‍රමාණය $l$ (ලීටර්) හා $ml$ (මිලි ලීටර්) වලින් ප්‍රකාශ කරන්න.

ලීටර් ........3......... මිලි ලීටර් ......65......... ———— (2)


16) සමචතුරස්‍රාකාර කුඩා කොටුවක පැත්තක දිග $1cm$ (සෙන්ටිමීටර්) නම් අඳුරුකර ඇති රූපයේ පරිමිතිය සොයන්න.

$12cm$ ———— (2)



17) රූපයේ දී ඇති තොරතුරු අනුව වෘත්තය මත පිහිටි ලක්ෂ 2 ට අදාළ ඉංග්‍රිසි අක්ෂර ලියන්න.

$C, D$ ———— (2)





18) 5 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවක එකස්ථානයේ තිබිය හැකි ඉලක්කම් මොනවාද?

0, 5 ———— (2)

19) ශිෂ්‍යයෙක් සමාන දිගින් යුතු ඉරටු 6 ක් හා ක්ලේ ගුලි (මැටි ) 4ක් භාවිතා කරමින් සකස්කල සැකිල්ලක ආකෘතියක් රූපයේ දැක්වේ. මෙම සැකිල්ලේ කඩදාසි ඇලවීමෙන් පසු ඔහුට සාදාගත හැකි ඝන වස්තුව කුමක්ද?

චතුස්තලය ———— (2)



20)

$\frac{1}{3}$ $\frac{7}{9}$ $\frac{1}{50}$ $\frac{7}{5}$ $\frac{4}{11}$ $\frac{1}{13}$

ඉහත කොටුව තුළ දැක්වෙන භාග සංඛ්‍යාවල ඇති පොදු ලක්ෂණ පදනම් කරගෙන කාණ්ඩ 2 කට වෙන්කර පහත සංවෘත රූප තුළ ලියන්න.

(2) ————

$\frac{1}{3}$ $\frac{1}{50}$ $\frac{1}{13}$ $\frac{7}{9}$

$\frac{7}{5}$ $\frac{4}{11}$

## ගණිතය - II කොටස

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**

1). a). i. $5:7$ අනුපාතය කියවන ආකාරය ලියන්න. (ල 01)

❖ පහ අනු හත / පහට හත

ii. පහත දී ඇති වගන්ති වලින් අනුපාත දැක්වෙන වගන්ති ඉදිරියෙන් $(\surd)$ ලකුණද , අනුපාතික දැක්වෙන වගන්ති ඉදිරියෙන් $(\times)$ ලකුණද යොදන්න.

- මලිත්ගේ වයස අවුරුදු 8 ක් ද ගනේෂ්ගේ වයස අවුරුදු 12 ක් ද වේ. ( √ )
- ඍජුකෝණාස්‍රාකාර මල් පාත්තියක දිග $3m$ ක් ද පළල $1\frac{1}{2}m$ ක් ද වේ. ( √ )
- තේ කෝප්පයක් සඳහා සීනි හැදි 2 ක් අවශ්‍යය වේ. ( × ) (ල 03)

iii. ලණු කැබලි දෙකක දිග පිළිවෙලින් $1m$ හා $250cm$ කී. එම දිග අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න. (ල 02)

1000 : 250 ◆ සරලම අනුපාතයට සම්පූර්ණ ලකුණු දෙන්න.

4 : 1

vi. $5:2$ අනුපාතයට තුල්‍ය අනුපාතයක් ලියන්න. (ල 01)

◆ ඕනෑම තුල්‍ය අනුපාතයකට ——— (1)

b). බේකරි නිෂ්පාදනයක් සඳහා පිටි $15kg$ කට සීනි $5kg$ ක් මිශ්‍ර කල යුතුය.

**i.** බේකරි නිෂ්පාදනයට ගන්නා පිටි හා සීනි අතර අනුපාතය සොයන්න. (ල 02)

15 : 5 ——— (1)

3 : 1 ——— (1)

ii. මෙම මිශ්‍රණයේ සීනි $1kg$ කට මිශ්‍ර කල යුතු පිටි ස්කන්ධය සොයන්න. (ල 01)

$3kg$

iii. මිශ්‍රණයේ $60kg$ ක ඇති සීනි ස්කන්ධය සොයන්න. (ල 03)

මිශ්‍රණයේ 4ට $kg$ කට සීනි ⟶ $1kg$ ——— (1)

මිශ්‍රණයේ $60kg$ කට සීනි ⟶ $1\times\frac{60}{4}$ ——— (1)

$=15kg$ ——— (1)

C ). ඇමරිකා එක්සත් ජනපදයේ සේවය කරන නිමේෂ්ගේ මාසික වැටුප ඇමෙරිකානු ඩොලර් 800 කි. එම මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් ගණනය කරන්න.

( ඇමෙරිකානු ඩොලර් 1ක් ශ්‍රී ලංකා රුපියල් 165 කි. ) (ල 03)

$160 \times 800 =$ රු. 128 000

(2) (1)

2). a) පාතිමා සතුව තිබූ රු.100 කින් රු. $a$ ප්‍රමාණයක් නිමාලිට දුන්නාය.

i. පාතිමා ලඟ ඉතිරි මුදල සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. (ල 02)

$(100 - a)$

ii. නිමාලිට දුන් මුදල රු. 45 ක් නම් පාතිමාට ඉතිරිවන මුදල ඉහත ගොඩනැගූ වීජීය ප්‍රකාශනය ඇසුරින් සොයන්න. (ල 02)

$100 - a$

$100 - 45$ ——— (1)

$=$ රු. 55 ——— (1)

iii. පාතිමා සතුව තිබූ රු.100 න් පාතිමාට ඉතිරිවන මුදල රු. 75.00ක් වීමට නම් නිමාලිට දිය යුතු මුදල සොයන්න. **(ල 02)**

$100 - 75$

$=$ රු. 25

b ). i. $3 \times 3 \times 3 \times 3$ දර්ශක ආකාරයෙන් ලියන්න. (ල 01)

$3^4$

ii. $2^3 \times 3^2$ අගය සොයන්න. (ල 03)

$2 \times 2 \times 2 \times 3 \times 3$ ——— (1)

$= 8 \times 9$ ——— (1)

$= 72$ ——— (1)

iii. $<$ හෝ $>$ හෝ $=$ යන සංකේත වලින් ගැලපෙන සංකේතය හිස්තැනට යොදන්න. (ල 01)

$4^2$ _ _ $>$ _ _ $3^2$

3). a ). රෝහලක එක් දිනක ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි 60 දෙනෙකුගේ රෝග පිළිබඳ තොරතුරු ඇතුලත් වගුවක් පහත දැක්වේ.

i. එහි හිස්තැන් පුරවන්න.

| රෝගය | ප්‍රගණන ලකුණු | සංඛ්‍යාව |
|---|---|---|
| උණ | ~~////~~ ~~////~~ /// | 13 |
| අක්ෂි ආබාධ | ~~////~~ ~~////~~ ~~////~~ //// | 19 —— (1) |
| දියවැඩියාව | ~~////~~ ~~////~~ ~~////~~ / | 16 —— (1) |
| අධි රුධිර පීඩනය | ~~////~~ //// | 9 |
| වකුගඩු රෝගය | /// —— (1) | 3 |

(ල 05)

වකුගඩු රෝගීන් $= 60 - (13 + 19 + 16 + 9)$

$= 60 - 57$

$= 3$ —— (2)

ii. වැඩිම රෝගීන් සංඛ්‍යාවක් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණ සිටියේ කුමන රෝගය සඳහාද? (ල 02)

අක්ෂි ආබාධ.

b). ඉහත වගුවේ තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක් මගින් පහත පරිදි නිරූපනය කර ඇත.

i. නිරූපනය කර ඇති තොරතුරු අනුව  රූපයෙන් නිරූපනය කර ඇති රෝගීන් සංඛ්‍යාව කීයද? (ල 01)

රෝගීන් 2. —— (1)

ii. ඒ අනුව පහත චිත්‍ර ප්‍රස්තාරයේ හිස්තැන් පුරවන්න.

| | |
|---|---|
| උණ |  |
| අක්ෂි ආබාධ |  —— (1) |
| දියවැඩියාව |  |
| අධි රුධිර පීඩනය |  —— (1) |
| වකුගඩු රෝගය |  —— (1) |

(ල 03)

4). a ). සම්පූර්ණයෙන් හිස්ව ඇති ජල ටැංකියකට $A$ හා $B$ නැමැති නල දෙකකින් ජලය සපයනු ලැබේ. $C$ නැමති නලයෙන් ජලය ඉවත්වේ.

- $A -$ නලයෙන් මිනිත්තු 15 ක දී ජලය $250l\ 750ml$ ක්ද, $B -$ නලයෙන් මිනිත්තු 15 ක දී ජලය $249l\ 500ml$ ක්ද ටැංකියට එකතුවේ.
- $C -$ නලයෙන් මිනිත්තු 15 ක දී ජලය $200l\ 500ml$ ක් ටැංකියෙන් ඉවත්වේ.

i. $C$ නලය වසා $A$ හා $B$ නල දෙක පමණක් මිනිත්තු 15 ක කාලයක් විවෘතව තැබුව හොත් ටැංකියට එකතුවන ජල ප්‍රමාණය සොයන්න. (ල 02)

$$\begin{array}{r} 250l\ 750ml \\ +\underline{249l\ 500ml} \\ \underline{\underline{500l\ 250ml}} \end{array}$$

——— 2

ii. මිනිත්තු 15 ක කාලයකදී $B$ නලයට වඩා , $A$ නලයෙන් කොපමණ ජල ප්‍රමාණයක් ටැංකියට එකතුවේද? (ල 02)


$$\begin{array}{r} 250l\ 750ml \\ -\underline{249l\ 500ml} \\ \underline{\underline{1l\ 250ml}} \end{array}$$

——— 2

iii. $A, B$ හා $C$ නල තුනම මිනිත්තු 15 ක කාලයක් විවෘතව තැබුවහොත් මිනිත්තු 15 අවසානයේ ටැංකියේ ඇති ජල ප්‍රමාණය සොයන්න. (ල 03)

$$\begin{array}{r} 500l\ 250\ ml \\ -\underline{200l\ 500ml} \\ \underline{299l\ 750\ ml} \end{array}$$

b). $X$ හා $Y$ යනු පතුලේ ප්‍රමාණය සමාන වූ උසින් පමණක් වෙනස් වූ භාජන දෙකකි.





i. කුඩා භාජනයේ ධාරිතාවය මිලි ලීටර් කීයද? (ල 02)

$1250ml$

ii. කුඩා භාජනය සම්පූර්ණයෙන් පුරවා විශාල භාජනය ජලයෙන් පිරවූයේ නම් වාර කීයකදී විශාල භාජනය පිරවිය හැකිදැයි නිමානය කරන්න. (ල 02)


නිවැරදි නිමානයට ලකුණු 2

5) i. පහත තල රූප අතරින් සරළ රේඛීය තල රූප තෝරා තිත් ඉර මත රූපයේ අක්ෂරය ලියන්න.




සරල රේඛීය තල රූප ........ B, C, E, G ........ (ල 04)

ශිෂ්‍යයෙක් කොටු කඩදාසියක සරළ රේඛීය තල රූප ඇසුරින් කරන ලද නිර්මාණයක් පහත දැක්වේ.




ii. $A, B, C$ ලෙස නද කළ සරල රේඛීය මායිම් වලින් වටවූ රූපවල නම් දී ඇති අක්ෂර ඉදිරියෙන් ලියන්න.

$A$ – ....... තුපිසියම .......

$B$ – ....... සෘජුකෝණාස්‍රය .......

$C$ – ....... සමාන්තරාස්‍රය .......

(ල 03)

iii. කොටු කඩදාසියේ එක් කොටුවකින් නිරූපිත වර්ගඵලය වර්ග සෙන්ටි මීටර් එකක් $(1cm^2)$ නම් ඉහත රූපයේ වර්ගඵලය වර්ග සෙන්ටි මීටර් වලින් සොයන්න. (ල 04)

A ——— 11
B ——— 30
අත් ——— 3
කකුල් ——— 8

$\underline{\underline{57cm^2}}$

6). a). $\frac{2}{5}$ ට තුල්‍ය භාගයක් ලබා ගැනීම සඳහා හිස් කොටු තුලට ගැලපෙන ඉලක්කම් යොදන්න.

i. $\frac{2}{5} \times \frac{\boxed{2}}{2} = \frac{\boxed{4}}{10}$ (ල 02)

$<$ හෝ $>$ යන සංකේත වලින් ගැලපෙන සංකේතය හිස්තැනට යොදන්න.

ii. $\frac{5}{7} \ldots > \ldots \frac{5}{9}$ (ල 01)

iii. $\frac{5}{7} \ldots > \ldots \frac{9}{14}$ (ල 01)

iv. $\frac{5}{7}, \frac{5}{9}, \frac{9}{14}$ අවරෝහණ පිළිවෙලට සකස් කරන්න. (ල 02)

$\frac{5}{7}, \frac{9}{14}, \frac{5}{9}$

b). වෙළෙන්දෙක් අඹ තොගයකින් $\frac{1}{2}$ පළමු දිනයේ ද, $\frac{3}{8}$ දෙවන දිනයේ ද විකුණන ලදී.

i. පළමු දිනයේ හා දෙවන දිනයේ විකුණු අඹ තොගය මුළු අඹ තොගයේ භාගයක් ලෙස දක්වන්න. (ල 03)

$\frac{1}{2} + \frac{3}{8}$

$= \frac{4}{8} + \frac{3}{8}$ ——— (2)

$= \frac{7}{8}$ ——— (1)

ii. දෙවන දිනයට වඩා පළමු දිනයේ විකුණු අඹ ප්‍රමාණය මුළු අඹ තොගයේ භාගයක් ලෙස දක්වන්න. (ල 02)

$\frac{1}{2} - \frac{3}{8}$

$= \frac{4}{8} - \frac{3}{8}$ ——— (1)

$= \frac{1}{8}$ ——— (1)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 06 | විෂයය / பாடம் / Subject : ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper : I,II | කාලය / காலம் / Time : පැය 02යි. |

නම :- ........................................................................................ විභාග අංකය :- ..........................

## I කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

(01) පහත සංඛ්‍යාව වචනයෙන් ලියන්න.
200 1540


(02) සුළු කරන්න. 652 x 36

(03) පහත දැක්වෙන සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියන්න.
-3 , 5 , 0 , 7 , 3

(04) රූපය පරීක්ෂාකර a, b යොදා ඇති කෝණ වර්ගයේ නම ලියන්න.

a = ........................................

b = ........................................




(05) රූපයේ දක්ත අනුව

(i) F හි සිට බලන විට B ලෙස පිහිටා ඇත්තේ කුමන දිශාවෙන් ද? ..................................................


(ii) E ට තිරස්ව පිහිටි ආකාරය කුමක් ද? ..................................................

| | | | | |
|---|---|---|---|---|
| A | | D | | G |
| | | | | |
| B | | E | | H |
| | | | | |
| C | | F | | I |

(06) (a) $\frac{4}{6}$ ට තුල්‍ය භාගයක් ලියන්න.

(b) විශාලම භාගය තෝරා යටින් ඉරක් අඳින්න. $\frac{1}{7}$ , $\frac{1}{3}$ , $\frac{1}{4}$

(07) පහත සඳහන් භාගවලට පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර එක් එක් කාණ්ඩයට අයත් භාග කොටුව තුළ ලියන්න. එම එක් එක් කාණ්ඩයට සුදුසු නම තිත් ඉර මත ලියන්න.



(08) අගය සොයන්න. 1. 7 + 0 . 3


(09) (i) 63 සංඛ්‍යාවේ එකස්ථානය හා දහයස්ථානය මාරුකර ලියූ විට ලැබෙන සංඛ්‍යාව ලියන්න. ...................................................

(ii) ඔබට ලැබුණේ කීවන සමචතුරස්‍ර සංඛ්‍යාව ද? ...................................................

(10) 27 හි සාධක සියල්ලම ලියන්න.

(11) එක් එක් අක්ෂරයට අනුව ගැළපෙන හැඩතලයේ නමට යා කරන්න.

| අක්ෂරය | නම |
|---|---|
| | ත්‍රිකෝණය |
| A | ත්‍රපීසියම |
| | සමචතුරස්‍රය |
| B | සෘජුකෝණාස්‍රය |
| C | සමාන්තරාස්‍රය |





(12) පහත එක් එක් ද්‍රව්‍යවල මිනුම් ලබාගැනීමට සුදුසු ම ඒකකය ලියන්න.

(i) රු. 10 කාසියක ඝනකම - ......................................

(ii) බස් රථයක දිග - ......................................


(13) විශාල භාජනයේ ජලය 1.5$l$ ක් ඇත.
එයින් 230$ml$ වන කුඩා භාජනය සම්පූර්ණයෙන් පිරවූ විට විශාල භාජනයේ ඉතිරි වන ජල පරිමාව කොපමණ ද?




(14) සවිධි ඝන වස්තුවක් සෑදීමට භාවිතා කරනු ලැබූ ආකෘතියක් රූපයේ දැක්වේ.

(i) මෙයින් සෑදිය හැකි ඝනවස්තුවේ නම ලියන්න.

(ii) සාදන ලද ඝනවස්තුවේ දාරයක දිග කොපමණ ද?



(15) සංඛ්‍යාවක අටෙහි ගුණාකාරයක් ආසන්න 10ට වැටයූ විට 70 බව ළමයෙක් පවසයි. එම අටෙහි ගුණාකාරය කීය ද?

(16) පස්වරු 2යි මිනිත්තු 6යි තත්පර 25 වේලාව අන්තර් ජාතික සම්මත ආකාරයට ලියා දක්වන්න.

(17) (i) 𝍸 𝍸 || ප්‍රගණන ලකුණුවලින් දක්වා ඇති සංඛ්‍යා ලියා දක්වන්න. ..........................

(ii) 8 සංඛ්‍යාව ප්‍රගණන ලකුණුවලින් ලියා දක්වන්න.

(18) 16 : 4 අනුපාතය සරල ම ආකාරයෙන් ලියන්න.

(19) $2^3$ ☐ $3^2$

හිස්කොටුවට ">" "<" හෝ "=" සුදුසු සංකේත තෝරා ලියන්න.

(20) සමචතුරස්‍රයක වර්ගඵලය $16cm^2$ වේ. එහි වර්ගඵලයට සමාන සෘජුකෝණාස්‍රයක පළල 2cm නම් එහි දිග සොයන්න.

## II කොටස

- **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.**

(01) (a) ඔබ පන්තියේ ඉගෙනගත් ස්කන්ධ පිළිබඳ පාඩම සිහිපත් කරන්න.
මෙහිදී ළමයෙක් ඝන. ද්‍රව, වායු යන සියල්ලට ම ස්කන්ධයක් ඇති බව පවසයි."

(i) මෙම ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද? (ලකුණු 01)

(ii) පහත ස්කන්ධ මැනීමට වඩාත් සුදුසු ඒකකය ලියන්න.

(අ) සහල් පුරවන ලද ගෝනියක බර

(ආ) අල්පෙනෙති 50ක දුර (ලකුණු 01)

(iii) පහත වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න.

| ආහාර ද්‍රව්‍ය | සතියක අවශ්‍ය ප්‍රමාණය | kg එකක මිල රු. | සතියක වියදම රු. |
|---|---|---|---|
| සහල් | 11kg | 82.00 | .................. |
| හාල්මැස්සන් | .................. | 420.00 | 105.00 |
| පරිප්පු | 500g | .................. | 90.00 |
| සීනි | .................. | 100.00 | 175.00 |
| එකතුව | .................. | .................. | .................. |

(ලකුණු 04)

(iv) ඉහත වගුවේ සඳහන් භාණ්ඩවල මුලු ස්කන්ධය කොපමණ ද? (ලකුණු 01)

(v) ඉහත වගුවට අනුව වැයවන මුලු මුදල කොපමණ ද? (ලකුණු 01)


(b) (i) අගය සොයන්න.

| *l* | *ml* |
|---|---|
| 5 | 650 |
| 3 | 725 |
| | |

(ii) බීම බෝතලයක බීම 2 500 ක් ඇත. එයින් ළමයෙක් 150 ක් බීමට ගත්තේ ය. බෝතලයේ ඉතිරි බීම ප්‍රමාණය කොපමණ ද?

(02) (a) (i) රූපයේ දක්ත අනුව දී ඇති සෘජුකෝණාස්‍රයේ පරිමිතිය කොපමණ ද? (ලකුණු 03)

(ii) මෙම සෘජුකෝණාස්‍රය තුළ ඇඳිය හැකි විශාල ම සමචතුරස්‍රයේ පැත්තක දිග කොපමණ ද? (ලකුණු 03)




(iii) ABCD සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය ඉහත II කොටසෙහි ඇඳි සමචතුරස්‍රයේ වර්ගඵලය මෙන් කී ගුණයක් ද? (ලකුණු 02)

(b) වෘත්තයක් ඇඳ වෘත්තය මත A ලක්ෂ්‍ය ද, වෘත්තයේ පිටත B ලක්ෂ්‍යය ද වෘත්තය ඇතුළත ලක්ෂ්‍යය ද ලකුණු කරන්න.

(03) (a) (i) $2^2 \times 3^2$ විහිදුවා ලියා අගය සොයන්න. (ලකුණු 03)

(ii) හිස්තැන් පුරවන්න.

$64 = 2^{\square} = 4^{\square} = \square^2$

(b) (i) පන්තියක මුළු ළමුන් ගණන 45කි. එක් දිනක ළමුන් P ප්‍රමාණයක් නොපැමිණියේ ය. එදින පන්තියේ සිටි ළමුන් ගණන සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න. (ලකුණු 03)

(ii) $p = 6$ නම් එදින පන්තියට පැමිණි ළමුන් ගණන සොයන්න. (ලකුණු 02)

(04) බණ්ඩාර, මුලරි, මොහොමඩ් යන ළමුන් තිදෙනකුගේ උස පිළිවෙළින් 112cm, 1m 28cm, 1.02m විය.

(i) ළමුන් තිදෙනාගේ උසවල් එකම ඒකකයකින් ලියන්න. (ලකුණු 02)

(ii) උසින් වැඩිම ළමයා කවුද හේතුව ලියන්න. (ලකුණු 02)

(iii) 108m 96cm + 4m 84cm අගය සොයන්න. (ලකුණු 02)

(iv) සුළු කරන්න.

$$\begin{array}{r} 82.68 \\ 5.49\ - \\ \hline \hline \end{array}$$

(ලකුණු 03)

(v) පහත සංඛ්‍යා අතුරින් විශාල ම සංඛ්‍යාව තෝරා ලියන්න.
2.091 , 1.928 , 0.999 (ලකුණු 02)

(05) (a) පියල් A හි සිට 30m ක් බටහිර දිශාවට ගමන් කර එතැන් සිට 10mක් උතුරු දිශාවට ගමන් කරයි. එතැන් සිට 30mක් නැගෙනහිර දිශාවට ගමන් කර B ස්ථානයට ළඟා වෙයි.

(i) ඉහත තොරතුරු දළ රූප සටහනකින් දක්වන්න. (ලකුණු 02)

(ii) පියල් අවසානයේ සිටි B ස්ථානයේ සිට මුල් පිහිටි A ස්ථානය කුමන දිශාවකින් පිහිටා ඇත් ද? (ලකුණු 02)

(iii) පියල් සිටි ආරම්භක ස්ථානයත් අවසාන ස්ථානයත් අතර දුර කොපමණ ද? (ලකුණු 02)

(b) (i) ඝනකයක හැඩයකට නිදසුනක් ලියන්න. (ලකුණු 01)

(ii) ඝනකයක පතොරමක් ඇඳ දක්වන්න. (ලකුණු 01)

(iii) ඝනකයක දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න. (ලකුණු 02)

(06) (a) කොළඹින් පෙ.ව. 11.45ට පිටත් වූ දුම්රියක් ගාල්ලට ළඟාවන්නේ පෙ.ව.2.30ට ය. කොළඹින් පිටත්වන බස් රථයක් ගාල්ලට යාමට පැය 2 මිනිත්තු 55ක් නොවේ.

(i) දුම්රියක් කොළඹින් පිටත්වූ මගියකුට ගාල්ලට යාමට ගතවන කාලය කොපමණ ද? (ලකුණු 03)

(ii) බස් රථයක් කොළඹින් පෙ.ව. 11.45 ගාල්ලට යාමට පිටත් වේ. එහි පිටත් වන මගියකු ගාල්ලට යාමට හැකිවන්නේ කීයට ද? (ලකුණු 03)

(iii) කොළඹ සිට ගාල්ලට යාමට වැඩි කාලයක් ගතවන්නේ දුම්රියට ද? බසයට ද? (ලකුණු 02)

(b) අගය සොයන්න. $\frac{1}{3}+\frac{1}{6}+\frac{1}{12}$ (ලකුණු 03)

(07) (a) පාසලක 6. 7. 8, 9 ශ්‍රේණිවල ළමා පොළක් පවත්වනු ලැබී ය. මෙහි දී එක් එක් ශ්‍රේණියෙන් ලැබුණු ආදායම පහත චිත්‍ර ප්‍රස්තාරයෙන් දැක්වේ.

 - රු.500 ක් නිරූපණය වේ.

| ශ්‍රේණිය | ආදායම |
|---|---|
| 6 |  |
| 7 |  |
| 8 |  |
| 9 |  |

(i) වැඩිම ආදායමක් ලැබුණු ශ්‍රේණිය කුමක් ද? (ලකුණු 01)

(ii) අඩුම ආදායමක් ලැබුණු ශ්‍රේණිය කුමක් ද? (ලකුණු 01)

(iii) පොළෙන් ලැබුණු මුළු ආදායම කීය ද? (ලකුණු 04)

(b) (i) ඇමරිකා එක්සත් ජනපද ඩොලරයක විටිනාකම ශ්‍රී ලංකා ඇමරිකානු ඩොලර් 12ක වටිනාකම ශ්‍රී ලංකාවේ රුපියල්වලින් කීය ද? (ලකුණු 03)

(ii) ඉන්ධන ලීටරයකින් 40km ක් ගමන් කරන යතුරු පැදියක් 120km ක දුරක් යාමට අවශ්‍ය ඉන්ධන ලීටර ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Western Province Education Department**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I, II** |

## ගණිතය I

(01) දෙමිලියන එක්දහස් පන්සිය හතලිහ —— (2)

(02) 23 472 —— (2)

(03) 5 3 0 -1 -3 —— (2)

(04) (i) a = පරාවර්ත කෝණ 1
(ii) b = මහාකෝණ 1 —— (2)

(05) (i) වයඹ 1
(ii) B හෝ H ඕනෑම එකක් 1 —— (2)

(06) (a) නිවැරදි භාගයකට 1
(b) $\frac{1}{3}$ 1 —— (2)

(07) කාණ්ඩය හා නම නිවැරදි නම් —— (2)
ලකුණු 1 බැගින්

(08) 2.0 —— (2)

(09) (i) 36 1
(ii) 6 වන 1 —— (2)

(10) 1, 3, 9, 27 —— (2)
එකක් වැරදි නම් 1

(11) නිවැරදි යා කිරීමට —— (2)
එකක් වැරදි නම් 1

(12) (i) mm 1
(ii) m 1 —— (2)

(13)
```
  1500
   230
  1270 ml
```
—— (2)

(14) (i) සවිධි චතුස්තලය 1
(ii) 4cm 1 —— (2)

(15) 72 —— (2)

(16) 14 : 06 : 25 —— (2)

(17) (i) 12 1
(ii) 卌 ||| 1 —— (2)

(18) 4 : 1 —— (2)

(19) < —— (2)

(20) 8cm —— (2)

## ගණිතය II

(01) (a) (i) සත්‍යයි —— (1)
(ii) (අ) kg —— (1)
(ආ) g —— (1)
(iv) 13kg 500g —— (2)
(v) රු.1272.00 —— (2)
(b) (i) 9*l* 375*ml* —— (2)
(ii) 2*l* 350*ml* —— (3)

(iii)

| ආහාර ද්‍රව්‍ය | සතියක අවශ්‍ය ප්‍රමාණය | kg එකක මිල රු. | සතියක වියදම රු. | |
|---|---|---|---|---|
| සහල් | 11kg | 82.00 | 902.00 | 1 |
| හාල්මැස්සන් | 250g | 420.00 | 105.00 | 1 |
| පරිප්පු | 500g | 180.00 | 90.00 | 1 |
| සීනි | 1750g | 100.00 | 175.00 | 1 |
| එකතුව | 13kg 500g | | 1272.00 | |

හිස්තැනට ලකුණු 1 බැගින් —— (4)

16

(02) (a) (i) 36cm —— (3)

(ii) 6cm —— (3)

(iii) ABCD හි ව.ඵ. = $72cm^2$ } —— (1)

සමචතුරස්‍රයේ ව.ඵ. = $36cm^2$ }

දෙගුණයකි. —— (1)

(b) නිවැරදි ලකුණු කිරීම් එකකට ලකුණු 1 බැගින් —— (3)

11

(03) (a) (i) 2 x 2 x 3 x 3 1

4 x 9 1

<u>36</u> 1 —— (3)

(ii) $64 = 2^{\boxed{6}} = 4^{\boxed{3}} = \boxed{8}^2$ —— (3)

(b) (i) 45 - p —— (3)

(ii) 45 - 6 = 39 —— (2)

11

(04) (i) නිවැරදිව ලිවීම —— (2)

(ii) මුරලි 1

නිවැරදි හේතුවකට 1 —— (2)


(iii) 113m 80cm —— (2)

(iv) 77.19 —— (3)

(v) 2.091 —— (2)

11

(05) (a) (i)




—— (2)

(ii) දකුණින් —— (2)

(iii) 10m —— (2)

(b) (i) නිවැරදි උදාහරණයක් —— (1)

(ii) නිවැරදි පතොරමක් —— (2)

(ඇලවුම් වාසි ඇත්නම් ලකුණු නැත)

(iii) දාර 12 1

ශීර්ෂ 8 1 —— (2)

11

(06) (a) (i)

| පැ. | මි. |
|---|---|
| 14 | 30 |
| 11 | 45 - |
| 2 | 45 |

නිවැරදි ගණනය කිරීමකට —— (3)

(ii)

| පැ. | මි. |
|---|---|
| 11 | 45 |
| 2 | 55 + |
| 14 | 40 |

නිවැරදි ගණනය කිරීමකට —— (3)

(iii) බස් රථයට —— (2)

(b) $\frac{1}{3} + \frac{1}{6} + \frac{1}{12} = \frac{4+2+1}{12}$ 2

$= \frac{7}{12}$ 1 —— (3)

11

(07) (a) (i) 7 —— (1)

(ii) 8 —— (1)

(iii) රු. 8750 —— (4)

(b) (i) 142 x 12 = රු.1704 —— (3)

(ii) $3l$ —— (2)

11

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 6 |

## තුන්වන වාර පරීක්ෂණය- 2017
## ගණිතය

පාසලේ නම : ...........................................................................................


ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..................................................

..................................................

කාලය : පැය 02 යි.

## A කොටස - සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1) පහත වෘත්තය ඇතුළත A ලක්ෂ්‍යයක්ද වෘත්තය මත B ලක්ෂ්‍යයක්ද ලකුණු කරන්න.




2) නවසිය අනූනව මිලියන නවසිය අනූනව දහස් නවසිය අනූනවයට එකක් එකතු කළවිට ලැබෙන සංඛ්‍යාව

I. සම්මත ආකාරයට ලියන්න.

II. කියවන ආකාරයට ලියන්න.


3)





A,B හා C යනු සමාන ඍජුකෝණාස්‍ර හැඩතල තුනකි. A හා B වලින් දැක්වෙන භාගවල එකතුව C රූපයේ අඳුරු කරන්න.

4) දී ඇති රූපයට ගැලපෙනසේ පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

ගුරුතුමිය සිටින්නේ කවිඳුට _____________ දිශාවෙන් හා අමල්ට _____________දිශාවෙනි.





5) වාහනයකට ඉන්ධන ලීටර 2 කින් 24 Km ක දුරක් ධාවනය කළ හැකිය. 60 Km ක දුරක් ධාවනය කිරීමට අවශ්‍ය ඉන්ධන ලීටර ගණන සොයන්න.

6) 


කොටු තුලට ගැලපෙන සංඛ්‍යා ලියන්න.

7) 1, 4, 9 .........., .......... රටාවේ ඊළගට සංඛ්‍යා දෙක ලියන්න.


8) 

කොටු ජාලය තුල පෙන්වා ඇති තල රූපය

හඳුන්වන නම කුමක්ද?

එහි ලක්ෂණයක් ලියන්න.

9) මලිත් ගණිත ප්‍රශ්න පත්‍රයක් සඳහා ලබාගත් ලකුණ ආසන්න 10 ට වැටයූවිට 60 කි. මලිත්ගේ ලකුණු ප්‍රමාණය සඳහා තිබිය හැකි අඩුම අගය සහ වැඩිම අගය ලියන්න.

10) 


i. සංඛ්‍යා රේඛාවේ A හා B මගින් නිරූපණය වන සංඛ්‍යා ලියා දක්වන්න.

ii. A හා B අතර ඇති සියලු නිඛිල ලියා දක්වන්න.

11) x =3 නම් 65- x හි අගය සොයන්න.

12) $36 = 6^{\square}$ හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න.


13) එක්තරා රූපවාහිනී වැඩසටහනක් ආරම්භ වූයේ ප.ව 2 පසුවී විනාඩි 30 තප්පර 5 ටය. එම වේලාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

14) 8 ∶ 2 = □ ∶ 1 හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න.

15) පහත සඳහන් ප්‍රකාශන හරි නම් ✔ ලකුණද වැරදි නම් × ලකුණද යොදන්න.

i. සුළු කෝණයකට සුළු කෝණයක් එකතු වීමෙන් මහා කෝණයක් සෑදිය හැකිය.(..........)

ii. මහා කෝණයකට සුළු කෝණයක් එකතු වීමෙන් මහා කෝණයක් සෑදිය හැකිය.(..........)

16)  මගින් සිසුන් 10 ක් නිරූපණය කරයි නම් සිසුන් 35 ක් රූප මගින් නිරූපණය කරන්න.

17)


$$\begin{array}{ccc} 6 & 2 & 4 \\ \square & 9 & \square \\ \hline 9 & \square & 8 \\ \hline \end{array}$$

හිස්තැන් පුරවන්න.

18) 6, 9 යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාරයක් වන කුඩාම සංඛ්‍යාව පහත සංඛ්‍යාවලින් තෝරා යටින් ඉරක් අඳින්න. 12 , 18 , 24 , 36 , 15

19) වම්බටු , කොමඩු , අන්නාසි , රාබු , ජම්බු , කැකිරි, මැංගුස් , රඹුටන් , කෙසෙල්

ඉහත දක්වා ඇති දෑ සුදුසු පරිදි කාණ්ඩ දෙකකට වෙන්කොට A හා B රවුම් තුල ලියා ඒවා සඳහා සුදුසු නම් 2 ක් ලියන්න.




20) පරිප්පු 6 Kg ක් මිලට ගත් සදුන් වෙළෙන්දෙකුට රුපියල් 1000 ක් දුන්නේය. ඔහුට ඉතිරි මුදල ලෙස රු.100 ක් ලැබුනි නම් පරිප්පු 1Kg ක මිල සොයන්න.

## B කොටස - පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

❖ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

1) (a) I. දිග මැනීම සඳහා භාවිතා කරන මිනුම් උපකරණ දෙකක නම් ලියන්න. (ල. 2)

II. පහත වගුවේ දක්වා ඇති දිග මැනීම සඳහා සුදුසුම මිනුම් උපකරණය හා මිනුම් ඒකක සඳහන් කරන්න. (ල. 4)


| මිනුම | මිනුම් උපකරණය | මිනුම් ඒකකය |
|---|---|---|
| වීදුරුවක ගැඹුර | | |
| කාසියක ඝනකම | | |
| ගසක වට ප්‍රමාණය | | |
| පන්ති කාමරයේ දිග | | |

III. රූපයේ දී ඇති පැන්සලේ දිග මැන ලියන්න. (ල. 2)



(b) සිසුන් කණ්ඩායමක් විසින් දිග මනින ලද සෙල්ලම් මිදුලක රූපසටහනක් පහත දැක්වේ.

I. සෙල්ලම් මිදුලේ පරිමිතිය මීටර්වලින් සොයන්න.




(ල. 3)

II. සෙල්ලම් මිදුල වටා කම්බි පොටවල් 5 කින් යුත් වැටක් ගැසිය යුතුව ඇත. ඒ සඳහා අවශ්‍යවන කම්බිවල දිග සොයන්න. (ල. 3)

III. කම්බි මීටරයක මිල රුපියල් 35 ක් වේ නම් කම්බි සඳහා වැයවන මුදල සොයන්න. (ල. 2)

2)

(a) වගා බිමකින් $\frac{3}{8}$ ක ප්‍රමාණයක එළවළු වගා කර ඇති අතර $\frac{1}{4}$ ක බිම් ප්‍රමාණයක මිරිස් වගා කර ඇත.

I. වැඩි බිම් ප්‍රමාණයක් වෙන්කර ඇත්තේ කුමන වගාව ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල. 2)

II. වගාවන් දෙකම සඳහා වෙන් කරන ලද බිම් ප්‍රමාණය කොපමණද? (ල. 3)

III. එළවළු හා මිරිස් වගා කළ පසු ඉතිරිවන බිමෙහි කෙසෙල් වගා කිරීමට අදහස් කරයි. කෙසෙල් වගාව සඳහා ඉතිරිව ඇති බිම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර භාගයක්ද? (ල. 2)

(b)

I. පහත දැක්වෙන භාග දශම සංඛ්‍යා ලෙස දක්වන්න. (ල. 2)

$\frac{7}{10}$ =………

$\frac{13}{100}$ =………

II. 0.83 + 7.5 අගය සොයන්න. (ල. 2)

3)

(a) I. චතුර ලග ඇති මුදල P නම් ඉන් රු. 15 ක් මල්ලිට දෙන ලදී. දැන් ඔහු ලග ඉතිරි මුදල දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ගොඩ නගන්න. (ල. 2)

II. චතුර ලග ඉතිරි වූ මුදල රු.65 ක් නම් ඔහු ලග තිබූ මුදල කීයද? (ල. 2)

(b) වසර අවසාන සාදයක් සඳහා 6 ශ්‍රේණියේ සිසුන් දොඩම් මිශ්‍ර බීම සකස් කිරීමට යෝජනා කරන ලදී. එහිදී 25 දෙනෙකු සඳහා දොඩම් යුෂ 500 ml කට ජලය 4 l ක් මිශ්‍ර කර දොඩම් බීම මිශ්‍රණය සකස් කරන ලදී.

I. දොඩම් යුෂ හා ජලය අතර අනුපාතය සරලම ආකාරයට ලියන්න. (ල. 2)

II. සාදයට සහභාගි වූ සංඛ්‍යාව 75 ක් නම් ඒ සඳහා අවශ්‍ය දොඩම් යුෂ හා ජලය ප්‍රමාණය වෙන වෙනම සොයන්න. එය අනුපාතයක් ලෙස දක්වන්න. (ල. 3)

III. එක් අයෙකුට ලැබෙන බීම ප්‍රමාණය මිලිලීටර කීයද? (ල. 2)

4) 6 ශ්‍රේණියේ ගණිත විෂයට අදාළ ඇගයීමකට සිසුන් 30 දෙනෙකු ලබාගත් ලකුණු පහත දැක්වේ.


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | 9 | 7 | 6 | 8 | 9 | 10 | 8 | 7 | 8 |
| 8 | 9 | 6 | 10 | 7 | 8 | 9 | 6 | 9 | 9 |
| 6 | 8 | 9 | 7 | 6 | 8 | 7 | 8 | 8 | 7 |

(a) I. ඉහත තොරතුරු ඇසුරින් මෙම වගුව සම්පූර්ණ කරන්න. (ල. 5)

| ලකුණු | ප්‍රගණන ලකුණු | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 6 | ........ | 5 |
| 7 | ~~llll~~ l | ........ |
| 8 | ........ | 10 |
| 9 | ........ | 7 |
| 10 | ll | ........ |

II. වැඩිම සිසුන් ප්‍රමාණයක් ලබා ඇත්තේ කිනම් ලකුණද? (ල. 1)

(b) වෙළෙන්දෙක් සතියේ දින 5 ක් තුල අලෙවි කළ දොඩම් ගෙඩි ගණන පහත දැක්වෙන චිත්‍ර ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.





I. වැඩිම දොඩම් ගෙඩි ප්‍රමාණයක් අලෙවි කළ දවස කුමක්ද? එම ප්‍රමාණය කොපමණද? (ල. 2)

II. සමාන දොඩම් ගෙඩි ප්‍රමාණයක් අලෙවි කළ දවස් මොනවාද?එම ප්‍රමාණය කීයද? (ල. 2)

III. සඳුදාට වඩා කොපමණ දොඩම් ගෙඩි ප්‍රමාණයක් අඟහරුවාදා අලෙවි කළේද? (ල. 1)

5)
(a) ඝනවස්තු පාඩමේ දී ක්‍රියාකාරකමක් සඳහා සකස් කළ පතරමක් රූපයේ දැක්වේ.



I. මෙම පතරම භාවිතාකර සාදාගත හැකි ඝන වස්තුවේ නම ලියන්න. (ල. 2)


II. ඉහත දක්වා ඇති ආකාරයේ එකම ප්‍රමාණයේ පතරම් 2 ක් යොදාගෙන සජිත් සහ අමත් සෑදූ ඝනවස්තු දෙකේ මුහුණත් දෙකක් එකට සිටින සේ අලවා අළුත් ඝනවස්තුවක් සාදන ලදී. එම ඝනවස්තුවේ

මුහුණත් ගණන ලියන්න.

ශීර්ෂ ගණන ලියන්න.

දාර ගණන ලියන්න. (ල. 3)

(b)




I. ඝනකම් කඩදාසියකින් සකස් කළ සෘජුකෝණාස්‍ර ආස්තරයක් රූපයේ දැක්වේ. එහි කුඩා කොටුවක වර්ගඵලය 1 $cm^2$ ක් නම් ABCD සෘජුකෝණාස්‍ර ආස්තරයේ වර්ගඵලය කොපමණද? (ල. 2)

II. රූපයේ ඇති පරිදි අඳුරු කළ ත්‍රිකෝණාකාර කොටස කපා ඉවත් කරයි නම් ඉවත් කරන ලද කොටසේ වර්ගඵලය කොපමණද? (ල. 2)

III. ඉතිරිවන කොටසේ වර්ගඵලය කොපමණද? (ල. 2)

6) මිල දර්ශනය

a)

| | |
|---|---|
| මිල දර්ශය | |
| සීනි 1 Kg | = රු.110.00 |
| අල 1 Kg | = රු.120.00 |
| තේ කුඩු 100g | = රු.150.00 |
| කිරි පිටි 400g | = රු.325.00 |
| හාල් 1 Kg | = රු.90.00 |

I. ඉහත මිල දර්ශනයට අනුව පහත සඳහන් බඩු බිල සඳහා වැය වන මුදල සොයන්න. (ල. 6)

| ආහාර ද්‍රව්‍ය | මුදල |
|---|---|
| සීනි $1\frac{1}{2}$ Kg | |
| අල 500 g | |
| තේ කුඩු 200 g | |
| කිරිපිටි 400 g පැකට් 2 | |
| හාල් 5 Kg | |
| එකතුව | |

II. මෙම බිලෙහි සඳහන් බඩු වල මුළු ස්කන්ධය සොයන්න. (ල. 2)

(b)

I. $5^{\,2} = 2^5$ බව සුධාරී පවසයි. එම ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය බව පැහැදිලි කරන්න. (ල. 3)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 6 |

## තුන්වන වාර පරීක්ෂණය- 2017
## ගණිතය


පාසලේ නම : ……………………………………………………………………

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ……………………………………………

……………………………………………… කාලය : පැය 02 යි.

## A කොටස - සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1) පහත වෘත්තය ඇතුළත A ලක්ෂ්‍යයක්ද වෘත්තය මත B ලක්ෂ්‍යයක්ද ලකුණු කරන්න.




(ල. 2)


2) නවසිය අනූනව මිලියන නවසිය අනූනව දහස් නවසිය අනූනවයට එකක් එකතු කළවිට ලැබෙන සංඛ්‍යාව

I. සම්මත ආකාරයට ලියන්න. 1 000 000 000

II. කියවන ආකාරයට ලියන්න. **එක් බිලියනයයි**

(ල. 2)

3)




A,B හා C යනු සමාන සෘජුකෝණාස්‍ර හැඩතල තුනකි. A හා B වලින් දැක්වෙන භාගවල එකතුව C රූපයේ අඳුරු කරන්න.


(ල. 2)

4) දී ඇති රූපයට ගැලපෙනසේ පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

(ල. 1)

ගුරුතුමිය සිටින්නේ කවිදුට **නිරිත** දිශාවෙන් හා අමල්ට **වයඹ** දිශාවෙනි.

(ල. 1)




5) වාහනයකට ඉන්ධන ලීටර 2 කින් 24 Km ක දුරක් ධාවනය කළ හැකිය. 60 Km ක දුරක් ධාවනය කිරීමට අවශ්‍ය ඉන්ධන ලීටර ගණන සොයන්න.

ලීටර 5 ——————— (ල. 2)

6) 3 × 4    6 ÷ 2    කොටු තුලට ගැලපෙන සංඛ්‍යා ලියන්න.

↓ 12 ÷ **3** ↓

↓ 4

**පිළිතුරු 3 ම නිවැරදි නම් ලකුණු 2 ක් ද**

**පිළිතුරු 2 ක් නිවැරදි නම් ලකුණු 1 ක් ද ලැබේ.**


**එක් පිළිතුරක් පමණක් නිවැරදි විට ලකුණු නොලැබේ.**

7) 1, 4, 9,**16**, **25** රටාවේ ඊළගට සංඛ්‍යා දෙක ලියන්න.

**(1)** **(1)**

(ල. 2)

8)



කොටු ජාලය තුල පෙන්වා ඇති තල රූපය

හඳුන්වන නම කුමක්ද?

**ත්‍රපීසියම** ______ (ල. 1)

එහි ලක්ෂණයක් ලියන්න.


**සම්මුඛ පාද දෙකක් පමණක් සමාන්තරය** ______ (ල. 1)

9) මලිත් ගණිත ප්‍රශ්න පත්‍රයක් සඳහා ලබාගත් ලකුණ ආසන්න 10 ට වැටයූවිට 60 කි. මලිත්ගේ ලකුණු ප්‍රමාණය සඳහා තිබිය හැකි අඩුම අගය සහ වැඩිම අගය ලියන්න.

**අඩුම අගය 55** ______ (ල. 1)

**වැඩිම අගය 64** ______ (ල. 1)

10)




**i.** සංඛ්‍යා රේඛාවේ A හා B මගින් නිරූපණය වන සංඛ්‍යා ලියා දක්වන්න. **A = -1**

**B = 2** (ල. 1)

ii. A හා B අතර ඇති සියලු නිඛිල ලියා දක්වන්න.

**0 , 1** (ල. 1)

11) x =3 නම් 65- x හි අගය සොයන්න.

$65 - 3$ (ල. 1)

$\underline{\underline{62}}$ (ල. 1)

12) 36 = 6 ☐ හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න.

$36 = 6^2$ (ල. 2)

13) එක්තරා රූපවාහිනී වැඩසටහනක් ආරම්භ වූයේ ප.ව 2 පසුවී විනාඩි 30 තප්පර 5 ටය. එම වේලාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

**14 : 30 : 05** (ල. 2)

14) 8 ∶ 2 = [ **4** ] ∶ 1 හිස් කොටුවට ගැලපෙන අගය ලියන්න.


(ල. 2)

15) පහත සඳහන් ප්‍රකාශන හරි නම් ✔ ලකුණද වැරදි නම් × ලකුණද යොදන්න.

i. සුළු කෝණයකට සුළු කෝණයක් එකතු වීමෙන් මහා කෝණයක් සෑදිය හැකිය.(√) (ල. 1)

**ii.** මහා කෝණයකට සුළු කෝණයක් එකතු වීමෙන් මහා කෝණයක් සෑදිය හැකිය.(√) (ල. 1)

16) මගින් සිසුන් 10 ක් නිරූපණය කරයි නම් සිසුන් 35 ක් රූප මගින් නිරූපණය කරන්න.



(ල. 2)

17)

|   |   |   |
|---|---|---|
| 6 | 2 | 4 |
| **2** | 9 | **4** |
| 9 | **1** | 8 |

හිස්තැන් පුරවන්න.


**පිළිතුරු 3 ම නිවැරදි නම් ලකුණු 2 ක් ද පිළිතුරු 2 ක් නිවැරදි නම් ලකුණු 1 ක් ද ලැබේ.**

**එක් පිළිතුරක් පමණක් නිවැරදි විට ලකුණු නොලැබේ.**

18) 6, 9 යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාරයක් වන කුඩාම සංඛ්‍යාව පහත සංඛ්‍යාවලින් තෝරා යටින් ඉරක් අඳින්න. 12 , 18 , 24 , 36 , 15

(ල. 2)

19) වම්බටු , කොමඩු , අන්නාසි , රාබු , ජම්බු , කැකිරි, මැංගුස් , රඹුටන් , කෙසෙල්
ඉහත දක්වා ඇති දෑ සුදුසු පරිදි කාණ්ඩ දෙකකට වෙන්කොට A හා B රවුම් තුල ලියා ඒවා සඳහා සුදුසු නම් 2 ක් ලියන්න.




20) පරිප්පු 6 Kg ක් මිලට ගත් සඳුන් වෙළෙන්දෙකුට රුපියල් 1000 ක් දුන්නේය. ඔහුට ඉතිරි මුදල ලෙස රු.100 ක් ලැබුනි නම් පරිප්පු 1Kg ක මිල සොයන්න.

$\frac{900}{6}$ =රු 150 (ල. 2)

**B කොටස - පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

❖ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

1) (a) I. දිග මැනීම සඳහා භාවිතා කරන මිනුම් උපකරණ දෙකක නම් ලියන්න. (ල. 2)

**සෙන්ටි මීටර් කෝදුව**
**මීටර් කෝදුව**
**ටේප් පටිය**

**ඕනෑම නිවැරදි පිළිතුරු 2 කට ලකුණු 2 ක් ලැබේ.**

II. පහත වගුවේ දක්වා ඇති දිග මැනීම සඳහා සුදුසුම මිනුම් උපකරණය හා මිනුම් ඒකක සඳහන් කරන්න. (ල. 4)

| මිනුම | මිනුම් උපකරණය | මිනුම් ඒකකය |
|---|---|---|
| වීදුරුවක ගැඹුර | සෙන්ටිමීටර කෝදුව | සෙන්ටිමීටර |
| කාසියක ඝනකම | සෙන්ටිමීටර කෝදුව | මිලිමීටර |
| ගසක වට ප්‍රමාණය | ටේප් පටිය | සෙන්ටිමීටර |
| පන්ති කාමරයේ දිග | මීටර කෝදුව | මීටරය |

(ල. 2) (ල. 2)


III. රූපයේ දී ඇති පැන්සලේ දිග මැන ලියන්න. (ල. 2)



**නිවැරදි අගයට ලකුණු 2 යි**

(b) සිසුන් කණ්ඩායමක් විසින් දිග මනින ලද සෙල්ලම් මිදුලක රූපසටහනක් පහත දැක්වේ.

I. සෙල්ලම් මිදුලේ පරිමිතිය මීටර්වලින් සොයන්න.




(ල. 3)

$$\begin{array}{r} 20 \\ 20 \\ \hline 40 \end{array} \qquad \begin{array}{r} 32 \\ 32 \\ \hline 64 \end{array}$$

(ල. 1) (ල. 1)

පරිමිතිය = 40 + 64
104m (ල. 1)

**II.** සෙල්ලම් මිදුල වටා කම්බි පොටවල් 5 කින් යුත් වැටක් ගැසිය යුතුව ඇත. ඒ සඳහා අවශ්‍යවන කම්බිවල දිග සොයන්න. (ල. 3)

$104 \times 5$ —— (ල. 1)

**520m** —— (ල. 2)

**III.** කම්බි මීටරයක මිල රුපියල් 35 ක් වේ නම් කම්බි සඳහා වැයවන මුදල සොයන්න. (ල. 2)

(ල. 1) —— $520 \times 35$ =රු 18200 ——

2)

(a) වගා බිමකින් $\frac{3}{8}$ ක ප්‍රමාණයක එළවළු වගා කර ඇති අතර $\frac{1}{4}$ ක බිම් ප්‍රමාණයක මිරිස් වගා කර ඇත.

I. වැඩි බිම් ප්‍රමාණයක් වෙන්කර ඇත්තේ කුමන වගාව ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල. 2)

එළවළු $\frac{3}{8}$ මිරිස් $\frac{1}{4} = \frac{2}{8}$

(ල. 1) —— $\frac{3}{8} > \frac{2}{8}$ වැඩි බිම් ප්‍රමාණය එළවළු —— (ල. 1)

**II.** වගාවන් දෙකම සඳහා වෙන් කරන ලද බිම් ප්‍රමාණය කොපමණද? (ල. 3)

(ල. 2) — $\frac{3}{8} + \frac{2}{8} = \frac{5}{8}$ —— (ල. 1)

**III.** එළවළු හා මිරිස් වගා කළ පසු ඉතිරිවන බිමෙහි කෙසෙල් වගා කිරීමට අදහස් කරයි. කෙසෙල් වගාව සඳහා ඉතිරිව ඇති බිම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර භාගයක්ද? (ල. 2)

මුළු ඉඩමෙන් $\frac{8}{8} - \frac{5}{8} = \frac{3}{8}$ —— (ල. 1)

(ල. 1)

(b)

I. පහත දැක්වෙන භාග දශම සංඛ්‍යා ලෙස දක්වන්න. (ල. 2)

$\frac{7}{10}$ =...**0.7**.. —— (ල. 1)

$\frac{13}{100}$ =...**0.13**... —— (ල. 1)

II. 0.83 + 7.5 අගය සොයන්න.

**8.33** —— (ල. 2) (ල. 2)

3)

(a) I. චතුර ලඟ ඇති මුදල P නම් ඉන් රු. 15 ක් මල්ලිට දෙන ලදී. දැන් ඔහු ලඟ ඉතිරි මුදල දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ගොඩ නගන්න. (ල. 2)

**P - 15**

II. චතුර ලඟ ඉතිරි වූ මුදල රු.65 ක් නම් ඔහු ලඟ තිබූ මුදල කීයද? (ල. 2)

**P -15 = 65** ——— (ල. 1)

**P = 80** ——— (ල. 1)

(b) වසර අවසාන සාදයක් සඳහා 6 ශ්‍රේණියේ සිසුන් දොඩම් මිශ්‍ර බීම සකස් කිරීමට යෝජනා කරන ලදී. එහිදී 25 දෙනෙකු සඳහා දොඩම් යුෂ 500 ml කට ජලය 4 l ක් මිශ්‍ර කර දොඩම් බීම මිශ්‍රණය සකස් කරන ලදී.

I. දොඩම් යුෂ හා ජලය අතර අනුපාතය සරලම ආකාරයට ලියන්න. (ල. 2)

**500 :4000** ——— (ල. 1)

**1 : 8** ——— (ල. 1)

II. සාදයට සහභාගි වූ සංඛ්‍යාව 75 ක් නම් ඒ සඳහා අවශ්‍ය දොඩම් යුෂ හා ජලය ප්‍රමාණය වෙන වෙනම සොයන්න. එය අනුපාතයක් ලෙස දක්වන්න. (ල. 3)

දොඩම් යුෂ 1500 ml ——— (ල. 1)

ජලය 12000 ml ——— (ල. 1)

**1500 :12000** ——— (ල. 1)

**1 : 8**

III. එක් අයෙකුට ලැබෙන බීම ප්‍රමාණය මිලිලීටර කීයද? (ල. 2)

(ල. 1) ——— $\frac{4500}{25} = 180ml$ ——— (ල. 1)

4) 6 ශ්‍රේණියේ ගණිත විෂයට අදාළ ඇගයීමකට සිසුන් 30 දෙනෙකු ලබාගත් ලකුණු පහත දැක්වේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | 9 | 7 | 6 | 8 | 9 | 10 | 8 | 7 | 8 |
| 8 | 9 | 6 | 10 | 7 | 8 | 9 | 6 | 9 | 9 |
| 6 | 8 | 9 | 7 | 6 | 8 | 7 | 8 | 8 | 7 |

(a) I. ඉහත තොරතුරු ඇසුරින් මෙම වගුව සම්පූර්ණ කරන්න. (ල. 5)


| ලකුණු | ප්‍රගණන ලකුණු | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 6 | .~~1111~~.. | 5 |
| 7 | ~~llll~~ l | ...6.... |
| 8 | .~~1111~~ ~~1111~~ | 10 |
| 9 | .~~1111~~ 11 | 7 |
| 10 | ll | ...2..... |

**නිවැරදි වගුවට** ——— (ල. 5)

II. වැඩිම සිසුන් ප්‍රමාණයක් ලබා ඇත්තේ කිනම් ලකුණද?

**ලකුණු 8** ——————— (ල. 1)

(b) වෙළෙන්දෙක් සතියේ දින 5 ක් තුල අලෙවි කළ දොඩම් ගෙඩි ගණන පහත දැක්වෙන චිත්‍ර ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.




**I.** වැඩිම දොඩම් ගෙඩි ප්‍රමාණයක් අලෙවි කළ දවස කුමක්ද? එම ප්‍රමාණය කොපමණද?

**ප්‍රමාණය = 20 × 5 = 100** **දවස —— බදාදා** (ල. 2)

**II.** සමාන දොඩම් ගෙඩි ප්‍රමාණයක් අලෙවි කළ දවස් මොනවාද?එම ප්‍රමාණය කීයද?

**20 × 3 = 60**

**එම දවස් → අඟහරුවාදා, සිකුරාදා** ——————— (ල. 2)

**III.** සඳුදාට වඩා කොපමණ දොඩම් ගෙඩි ප්‍රමාණයක් අඟහරුවාදා අලෙවි කලේද?


**අඟහරුවාදා** → 60

**සඳුදා** → 45

**දොඩම් ගෙඩි** 15 (ල. 1)

5)

(a) ඝනවස්තු පාඩමේ දී ක්‍රියාකාරකමක් සඳහා සකස් කළ පතරමක් රූපයේ දැක්වේ.



**I.** මෙම පතරම භාවිතාකර සාදාගත හැකි ඝන වස්තුවේ නම ලියන්න.

සවිධි චතුස්තලය (ල. 2)


II. ඉහත දක්වා ඇති ආකාරයේ එකම ප්‍රමාණයේ පතරම් 2 ක් යොදාගෙන සජිත් සහ අමත් සෑදූ ඝනවස්තු දෙකේ මුහුණත් දෙකක් එකට සිටින සේ අලවා අළුත් ඝනවස්තුවක් සාදන ලදී. එම ඝනවස්තුවේ

මුහුණත් ගණන ලියන්න. **6** ——— (ල. 1)

ශීර්ෂ ගණන ලියන්න. **5** ——— (ල. 1)

දාර ගණන ලියන්න. **9** ——— (ල. 1) (ල. 3)

(b)




**I.** ඝනකම් කඩදාසියකින් සකස් කළ සෘජුකෝණාස්‍ර ආස්තරයක් රූපයේ දැක්වේ. එහි කුඩා කොටුවක වර්ගඵලය 1 $cm^2$ ක් නම් ABCD සෘජුකෝණාස්‍ර ආස්තරයේ වර්ගඵලය කොපමණද? (ල. 2)

$5 \times 3 = 15cm^2$

(ල. 1) (ල. 1)

**II.** රූපයේ ඇති පරිදි අඳුරු කළ ත්‍රිකෝණාකාර කොටස කපා ඉවත් කරයි නම් ඉවත් කරන ලද කොටසේ වර්ගඵලය කොපමණද?

$5cm^2$ ——— (ල. 2)

**III.** ඉතිරිවන කොටසේ වර්ගඵලය කොපමණද? (ල. 2)

$15 - 5$ ——— (ල. 1)

$10cm^2$ ——— (ල. 1)

6) මිල දර්ශනය

a)

| | |
|---|---|
| මිල දර්ශය | |
| සීනි 1 Kg | = රු.110.00 |
| අල 1 Kg | = රු.120.00 |
| තේ කුඩු 100g | = රු.150.00 |
| කිරි පිටි 400g | = රු.325.00 |
| හාල් 1 Kg | = රු.90.00 |

I. ඉහත මිල දර්ශනයට අනුව පහත සඳහන් බඩු බිල සඳහා වැය වන මුදල සොයන්න. (ල. 6)

| ආහාර ද්‍රව්‍ය | මුදල |
|---|---|
| සීනි $1\frac{1}{2}$ Kg | 165 |
| අල 500 g | 60 |
| තේ කුඩු 200 g | 300 |
| කිරිපිටි 400 g පැකට් 2 | 650 |
| හාල් 5 Kg | 450 |
| එකතුව | 1625 |

**(ල. 1) බැගින් ලබා දෙන්න**

II. මෙම බිලෙහි සඳහන් බඩු වල මුළු ස්කන්ධය සොයන්න.

| | Kg | g |
|---|---|---|
| සීනි | 1 | 500 |
| අල | 0 | 500 |
| තේ කොළ | 0 | 200 |
| කිරිපිටි | 0 | 800 |
| හාල් | 5 | 000 |
| | 8 | 000 |

8 Kg —— (ල. 2)

(b)

I. $5^{2} = 2^{5}$ බව සුධාරී පවසයි. එම ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය බව පැහැදිලි කරන්න. (ල. 3)

$\mathbf{5 \times 5 = 25 \qquad 2 \times 2 \times 2 \times 2 \times 2}$ —— (ල. 1)

$\mathbf{5^2 \quad 2^5}$

$\mathbf{25 < 32}$ —— (ල. 1)

**ඉහත ප්‍රකාශනය අසත්‍යවේ.** —— (ල. 1)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## ගණිතය

**නම/විභාග අංකය :-** ........................................................ **කාලය: පැය 02 යි.**

I කොටස

- පළමු ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සියල්ලටමත් II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 5කටත් පිළිතුරු සපයන්න.
- පළමු පත්‍රයේ එක් ප්‍රශ්නයකට ලකුණු 2කි.

(01) 175ට අඩු 9හි විශාලම ගුණාකාරය කීය ද?

(02) පොතක මිල රු. 16.00කි.

(i) පොත් 8ක මිල කීය ද?

(ii) එය 16හිත් 8හිත් ගුණාකාර වේද?

(03) අඩු කරන්න.


$$\begin{array}{r} 2.08 \\ -\ 1.99 \\ \hline \\ \hline \hline \end{array}$$

(04) පහත වගන්ති හරි නම් (✓) ද වැරදි නම් (✗) ද හිස් කොටුව මත යොදන්න.

(i) 1, 2, 3, 5, 7 යනු 1 සිට 10 තෙක් ඇති ප්‍රථමක සංඛ්‍යා වේ. ☐

(ii) 4, 6, 8, 9 යනු 1 සිට 10 දක්වා ඇති සංයුත සංඛ්‍යා වේ. ☐


(05) රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.





(06) අනූ නව බිලියන දෙක යන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

(07) 56 × 63 = .............................. හිස්තැනට සුදුසු පිළිතුර යොදන්න.

(08) හිස්තැනට සුදුසු අගයයන් ලියන්න.




(09)




ඉහත සංඛ්‍යා රේඛාව මත -2 සිට 2 දක්වා ඇති නිඛිල නිරූපණය කරන්න.

(10) '<' හා '>' අතුරින් සුදුසු සංකේතය යොදන්න.

(i) (-6) ............................ (+2)    (ii) (+1) ............................ (-1)

(11) සචිනි විද්‍යාව විෂයය සඳහා ලබාගත් ලකුණු 52කි. විනුලි සචිනිට වඩා වැඩි ලකුණක් ලබාගත් අතර ඇයගේ ලකුණු ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට 50 විය. විනුලි ලබාගත් සැබෑ ලකුණු සඳහා විය හැකි අගයන් මොනවා ද?

..............................................................................

(12) පහත දිනය සහ වේලාව අන්තර් ජාතික සම්මත ආකාරයට ලියන්න.


(i) 2020 නොවැම්බර් 5 - ..................................................................

(ii) ප.ව. 5.45 - ..................................................................

(13) එකතු කරන්න.

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 11 | 37 |
| + | 08 | 40 |
| | | |


(14) රූප සටහනේ දැක්වෙන සමූහය සුදුසු පරිදි ගොඩවල් දෙකකට වෙන් කරන්න. සුදුසු නමක් තිත් ඉරි මත ලියන්න.




........................... .........................

(15) x සඳහා දී ඇති අගය ආදේශයෙන් හිස්තැනෙහි අගය ලබා ගන්න.

| x හි අගය | x - 1 | x + 7 |
|---|---|---|
| 15 | ...................... | ...................... |
| 20 | ...................... | ...................... |

(16) 

මෙම රූපයේ,

(i) අඳුරු කළ කොටස භාගයක් ලෙස ලියන්න.

(ii) එම භාගය දශම ලෙස ලියන්න.

(17) නිවැරදි පිළිතුර ලැබෙන පරිදි යා කරන්න.

0.2 + 0.4


7.3 - 2.6

1.2 + 3.5

0.9 - 0.3


0.6

4.7

(18) 


රූපයේ පෙන්වා ඇති දශම සංඛ්‍යා නිරූපණය වන ලෙස කොටු ජාලය පාට කරන්න.

---

(19) 

රූපයේ පෙන්වා ඇති තල රූපය,
සංවෘත සරල රේඛීය තල රූපයක් වේ ද? හේතු දක්වන්න.

---

(20) (i) වක්‍ර දාර පමණක් ඇති ඝන වස්තුවක් නම් කරන්න. ...............................................................

(ii) 1349cm මීටර වලින් ලියන්න. ...........................................


---

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

---

(01) රූපයේ දක්වා ඇති තලරූප හොඳින් නිරීක්ෂණය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(a) ඉහත දක්වා ඇති රූපයේ ගස තිබෙන ස්ථානයේ සිට බලන විට එක් එක් තල රූපය පිහිටි දිශාව නිවැරදිව යා කරන්න.

| | |
|---|---|
| සෘජුකෝණාස්‍රය | නිරිත |
| සමචතුරස්‍රය | දකුණ |
| රොම්බසය | බටහිර |
| සමාන්තරාස්‍රය | වයඹ |
| A චතුරස්‍රය | උතුර |
| B ත්‍රිකෝණය | නැගෙනහිර |
| C ත්‍රිකෝණය | ඊසාන |
| | ගිණිකොණ |

(ලකුණු 04)

(b) ඉහත රූපසටහනේ අංක යොදා ඇති කෝණ හඳුන්වන නම් ලියන්න.

1. ............................................................ 4. ............................................................
2. ............................................................ 5. ............................................................
3. ............................................................


(ලකුණු 05)

(c) ඉහත රූප සටහනේ,

(i) ගසට සිරස්ව ඉහළින් පිහිටි තල රූපය කුමක් ද? ...................................................................... (ලකුණු 01)

(ii) B ත්‍රිකෝණයට තිරස්ව පිහිටි තල රූප නම් කරන්න. ................................................................. (ලකුණු 02)

(02) පහත රූපයෙන් දැක්වෙනුයේ වෘත්තාකාර ආස්තර එකිනෙක මත ඇලවීමෙන් නිර්මාණය කරන ලද පණුවෙකි. වෘත්තාකාර ආස්තර මත අංක යොදා ඇත.




(a) (i) නිර්මාණය සඳහා යොදා ගන්නා ලද වෘත්තාකාර ආස්තර ගණන කීය ද? .......................................... (ලකුණු 01)

(b) ඉහත නිර්මාණයේ වෘත්තාකාර ආස්තර මගින් දැක්වෙන සංඛ්‍යා අතුරෙන්,

(i) ප්‍රථමක සංඛ්‍යා 2ක් ........................................ , .......................................... (ලකුණු 01)
(1 ත් 10ත් අතර පිහිටි)

(ii) ත්‍රිකෝණ සංඛ්‍යා 2ක් ........................................ , .......................................... (ලකුණු 01)
(1ත් 10ත් අතර පිහිටි)

(iii) සමචතුරස්‍ර සංඛ්‍යා 2ක් ........................................ , .......................................... (ලකුණු 01)
(1ත් 10ත් අතර පිහිටි)

(iv) සාධක 3ක් පමණක් ඇති සංඛ්‍යා 2ක් ........................................ , .......................................... (ලකුණු 01)


(v) 32හි සාධක සියල්ලම ලියන්න. ........................................ , .......................................... (ලකුණු 02)

(c) (i) ඉහත රූපයේ දැක්වෙන සංඛ්‍යා සියල්ලම ආරෝහණ පිළිවෙලට ලියූ විට සෑදෙන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න. ........................................ , .......................................... (ලකුණු 01)

(ii) එම සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියන්න. ..................................................................
............................................................................ (ලකුණු 01)

(iii) එම සංඛ්‍යාවේ 6 ඉලක්කම පිහිටි,
ස්ථානය ......................................................................
ස්ථානීය අගය ................................................................
නිරූපණය වන අගය .....................................................
ලියන්න. (ලකුණු 03)

(03) (a)




(i) මෙම රූපයේ හිස් කොටුවලට අදාල නම් වරහන තුළින් තෝරා නිවැරදිව ලියන්න. (බලය, දර්ශකය, පාදය)

A - .................................. B - .................................. C - .................................. (ලකුණු 03)


(ii) $2^3 \times 5$ අගය සොයන්න. ......................................................................... (ලකුණු 02)

(iii) 81, 3හි බලයක් ලෙස ලියන්න. .............................................................. (ලකුණු 01)

(iv) 4හි තුන් ගුණය කීය ද? ................................................................... (ලකුණු 01)

(v) 4හි තුන්වන බලය කීය ද? ............................................................ (ලකුණු 01)

(b)



මෙම කොටු ජාලයේ කුඩා කොටුවක වර්ගඵලය $1cm^2$ නම්,

(i) අඳුරු කල කොටසේ වර්ගඵලය $cm^2$ කීය ද?

.................................................. (ලකුණු 01)

(ii) අඳුරු නොකල කොටසේ වර්ගඵලය $cm^2$ කීය ද?

................................................ (ලකුණු 01)

(iii) කොටු ජාලයේ අඳුරු කල කොටු ගණන මුලු කොටු ගණනේ භාගයක් ලෙස ලියන්න. ............................................... (ලකුණු 02)

---

(04)

$\frac{2}{5}$ $\frac{1}{2}$ 0.2 $\frac{77}{100}$ $\frac{3}{10}$ $\frac{1}{6}$ 0.73 $\frac{7}{9}$ 0.5 $\frac{4}{6}$ $\frac{5}{6}$ 0.8

(a) ඉහත රූපයේ ඇති භාග හා දශම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඒකක භාග 2ක් ලියන්න.................................... , .................................... (ලකුණු 01)

(ii) තත්‍ය භාග 4ක් ලියන්න. ...................... , .................... , ......................... , .................... (ලකුණු 02)

(iii) $\frac{2}{3}$ ට තුල්‍ය භාගයක් ලියන්න. .......................................... (ලකුණු 01)


(iv) $\frac{2}{10}$ ට අදාළ දශම සංඛ්‍යාව ලියන්න. ................................ (ලකුණු 01)

(v) '<','>' අතරින් නිවැරදි සංකේතය දී ඇති හිස්තැන මත යොදා ලියන්න.


0.2 ..................... 0.8 $\frac{1}{2}$ ........................ $\frac{1}{6}$

0.78 .................. 0.77 $\frac{2}{5}$ ........................ $\frac{3}{10}$ (ලකුණු 04)

(b)




ඉකුත් දින 4 තුල වාර්තා වූ කොරෝනා රෝගීන් පිළිබඳව තොරතුරු ඉහත චිත්‍ර ප්‍රස්තාරයෙන් දක්වා ඇත.

(i) සඳුදා වාර්තා වූ කොරෝනා රෝගීන් ගණන 325ක් නම්  සංකේතයෙන් නිරූපිත අගය කීය ද? (ලකුණු 01)


....................................................

(ii) බ්‍රහස්පතින්දා වාර්තා වූ කොරෝනා රෝගීන් ගණන 650 ක් නම් එය චිත්‍ර ප්‍රස්තාරයේ නිරූපණය කරන්න (ලකුණු 01)

(05) (a)




ගෙඩියක මිල රු. x වේ.
කූඩයේ බර 10kg කි.




ගෙඩියක මිල රු. 70 කි.
කූඩයේ බර 8kg 300g කි.

ඉහත රූප සටහන භාවිතයෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) ගස්ලබු ගෙඩියක් හා පැණි කොමඩු ගෙඩියක් ගැනීමට වැයවන මුදල වීජීය ප්‍රකාශනයකින් ලියන්න.
.............................................................. (ලකුණු 01)

(ii) ගස්ලබු ගෙඩියක් රු. 60.00 නම් ඉහත ඔබ ලියන ලද ප්‍රකාශනයේ අගය සොයන්න.
.............................................................. (ලකුණු 01)

(b) (i) ගස්ලබු කූඩයේ ස්කන්ධය හා පැණි කොමඩු කූඩයේ ස්කන්ධය g වලින් ලියන්න.

ගස්ලබු කූඩයේ ස්කන්ධය = ...........................................

පැණි කොමඩු කූඩයේ ස්කන්ධය = ........................................... (ලකුණු 02)

(ii) ගස්ලබු හා පැණි කොමඩු කූඩ දෙකෙහිම මුලු ස්කන්ධය කොපමණ ද? ........................................... (ලකුණු 02)


(iii) පැණිකොමඩු කූඩයට වඩා ගස්ලබු කූඩයේ ස්කන්ධය කොපමණ ප්‍රමාණයකින් වැඩි ද?
.......................................... (ලකුණු 02)

(c) (i) ගස්ලබු කූඩයේ ගෙඩි 12ක් හා පැණි කොමඩු කූඩයේ ගෙඩි 9ක් තිබුණේ නම් ගස්ලබු හා පැණි කොමඩු ගෙඩි ගණන අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියන්න. ...................................... (ලකුණු 02)

(ii) ඉහත අනුපාතයටම ගස්ලබු කූඩයේ ගෙඩි 20ක් තිබෙන විට පැණි කොමඩු කූඩයේ ඇති ගෙඩි ගණන කීය ද?
................................................ (ලකුණු 02)

---

(06)




(a) A, B, C යනු භාජන 3කි.

- C භාජනය ජලයෙන් සම්පූර්ණයෙන් පුරවා වාර 2ක් B භාජනයට දැමූ විට B භාජනය සම්පූර්ණයෙන් පිරේ.
- B භාජනයෙන් වාර 2ක් A භාජනයට දැමූ විට A භාජනය සම්පූර්ණයෙන් පිරේ.


(i) B භාජනයට දැමිය හැකි ජල පරිමාව *ml* කොපමණ ද? ...................................................... (ලකුණු 02)

(ii) C භාජනයට දැමිය හැකි ජල පරිමාව *l* කොපමණ ද? ........................................................... (ලකුණු 01)

(iii) A භාජනය පිරවීමට C භාජනයෙන් වාර කීයක් දැමිය යුතු ද? ............................................... (ලකුණු 01)

(iv) C භාජනයට වඩා A භාජනයේ කොපමණ ජල පරිමාවක් වැඩිපුර ඇත් ද? ....................................... (ලකුණු 02)

(b)




රූපයේ දැක්වෙන්නේ A හා B ලෙස නම් කර ඇති පෙට්ටි 2කි.

(i) A හා B හැඩය ඇති ඝනවස්තු දෙක නම් කරන්න. (ලකුණු 02)

A - ..........................................    B - ..............................................

(ii) A හා B පෙට්ටි දෙකේ දැකිය හැකි සමාන හා අසමාන ලක්ෂණයක් බැගින් ලියන්න.

සමාන - ..................................................................................................

අසමාන - ...............................................................................................  (ලකුණු 02)

(iii) A මුහුණතේ දිග 12cm හා පළල 5cm නම් එම මුහුණතේ පරිමිතිය සොයන්න.

................................................  (ලකුණු 02)

(07) (a)

| 40 | 75 | 2400 | 60 | 37 | 2500 |
|---|---|---|---|---|---|
| ම | ය | ස | ට | ල් | ග |

- ඔබට සංඛ්‍යා කීපයක් හා ඊට අදාළ අක්ෂරයක් ඉහත රූප සටහන්වල පෙන්වා ඇත.
- ඔබ මුලින් ම පහත ප්‍රශ්නවලට පිළිතුරු අදාළ හිස් කොටු මත ලියන්න.
- ඊට පසුව ප්‍රශ්න අංක (b) කොටස සඳහා පිළිතුර ලියන්න.

(i) 364 + 2036 = ☐

(ii) 2036 - ☐ = 1999

(iii) 25 × 100 = ☐

(iv) 24000 ÷ 10 = ☐

(v) 525 ÷ 7 = ☐

(vi) තත්පර 3600කට ඇති මිනිත්තු ගණන කීය ද? ☐

(vii) මිනිත්තු 40කට ඇති තත්පර ගණන කීය ද? ☐

(viii) ගාල්ලෙන් පෙ.ව. 4.55ට පිටත් වූ බස් රථයක් 30km දුරක් ගොස් නතර කරන විට වේලාව පෙ.ව. 5.32 විය. බස් රථයට 30km දුර යාමට ගත වූ කාලය මිනිත්තු කීය ද? ☐

(ix) 37 ආසන්න 10ට වටයන්න. ☐

(x) 

ඉහත ප්‍රගණන ලකුණු වලින් දක්වා ඇති සංඛ්‍යාව කීය ද? ☐

(ලකුණු 10)

(b) ඔබ ලියූ පිළිතුරු වලට අදාල අකුරු ප්‍රශ්න අංක පිළිවෙලට ගලපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

.......................................................................................................................................  (ලකුණු 02)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## ගණිතය

## පිළිතුරු

### ගණිතය I

(01) 171 (ල. 02)

(02) 16 × 8 = රු. 128 (ල. 01)

ඔව් (ල. 01)

(03) 0.09 (ල. 02)

(04) (i) × (ii) ✓ (ල. 1 බැගින් ල. 02)

(05) (i) 6.4cm (ල. 01)


(ii) 15cm 4mm / 154mm (ල. 02)

(06) 99 000 000 002 (ල. 02)

(07) 3528 (ල. 02)

(08) 6, 4 (ල.1 බැගින් ල. 02)

(09)




(ල. ½ බැගින් ල. 02)

(10) <, > (ල. 02)

(11) 53 හෝ 54 (ල. 02) (ල. 02)

(12) 2020.11.05 (ල. 01)

17:45 (ල. 01)

(13) පැය මිනිත්තු

20 17 (ල. 02)

(14) km, mm, m, cm — දිග මනින ඒකක (ල. 01)

kg, g, mg — බර මනින ඒකක (ල. 01)

(15) 15 → 14 22

20 → 19 27 (ල. ½ බැගින් ල. 02)

(16) (i) $\frac{3}{10}$ (ii) 0.3 (ල. 02)

(17) නිවැරදිව යා කිරීමට (ල. ½ බැගින් ල. 02)

(18) තීරු 2ක් හෝ කොටස් 20ක් පාට කිරීමට (ල. 02)

(19) නොවේ. (ල. 01)

වක්‍ර රේඛා ඛණ්ඩයක් ඇති නිසා (ල. 01)

(20) (i) සිලින්ඩරය වැනි ඕනෑම පිළිතුරක් (ල. 01)

(ii) 13.49m (ල. 01)

### ගණිතය II

(01) (a) නිවැරදිව යා කිරීමට
(එකකට ල. ½ බැගින් ල. 04)

(b) 1 - මහා කෝණය
2 - සුළු කෝණය
3 - සෘජු කෝණය
4 - පරාවර්ත කෝණය
5 - සරල කෝණය (ල. 05)

(c) (i) සෘජුකෝණාස්‍රය (ල. 01)

(ii) සමචතුරස්‍රය හා සමාන්තරාස්‍රය (ල. 02)

(02) (a) (i) 10 (ල. 01)

(b) (i) 2, 3, 5, 7 ඕනෑම 2ක් (ල. 01)

(ii) 3, 6 (ල. 01)

(iii) 4, 9 (ල. 01)

(iv) 4 හා 9 (ල. 01)

(v) 1, 2, 4, 8, 16, 32 (ල. 02)

(c) (i) 2 233 456 779 (ල. 01)

(ii) දෙබිලියන දෙසිය විසි තුන් මිලියන හාරසිය පනස් හයදහස් හත්සිය හැත්තෑ නවය. (ල. 01)

(iii) දහස්ථානය, 1000, 6000 (ල. 03)

---

(03) (a) (i) A - දර්ශකය

B - පාදය

C - බලය (ල. 03)

(ii) $2 \times 2 \times 2 \times 5 = 40$ (ල. 02)

(iii) $3^4$ (ල. 01)

(iv) 12 (ල. 01)

(v) 64 (ල. 01)

(b) (i) $9cm^2$ (ල. 01)

(ii) $16cm^2$ (ල. 01)

(iii) $\frac{9}{25}$ (ල. 02)

---

(04) (a) (i) $\frac{1}{2}, \frac{1}{6}$ (ල. 01)

(ii) $\frac{2}{5}, \frac{3}{10}, \frac{4}{6}, \frac{5}{6}, \frac{1}{2}, \frac{1}{6}, \frac{7}{9}$

(ඕනෑම 4ක්) (ල. 02)

(iii) $\frac{4}{6}$ (ල. 01)

(iv) 0.2 (ල. 01)

(v) $0.2 < 0.8$ $\quad 0.78 > 0.77$

$\frac{1}{2} > \frac{1}{6}$ $\quad \frac{2}{5} > \frac{3}{10}$ (ල. 04)

(b) (i) 100 (ල. 01)

(ii)  (ල. 02)

---

(05) (a) (i) x + 70 (ල. 01)

(ii) 60 + 70 = රු. 130 (ල. 01)

(b) (i) 10000kg 8300g (ල. 02)

(ii) 18kg 300g (ල. 02)

(iii) 1kg 700g (ල. 02)

(c) (i) 12 : 9 = 4 : 3 (ල. 02)

(ii) 15 (ල. 02)

---

(06) (a) (i) 4400*ml* (ල. 02)

(ii) 2.2*l* (ල. 01)

(iii) 4 (ල. 01)

(iv) 6600*ml* (ල. 02)

(b) (i) A - ඝනකාභය

B - ඝනකය (ල. 02)

(ii)
- මුහුණත් ගණන සමාන වේ.
  දාර ගණන සමාන වේ.
  ශීර්ෂ ගණන සමාන වේ. (ල. 01)
  වැනි එක් හේතුවක්
- අසමාන
  Aහි මුහුණත් එකිනෙකට අසමාන වන අතර B මුහුණත් සියල්ල එකිනෙකට සමාන වේ. (ල. 01)

(iii) 34cm (ල. 02)

(07) (a) (i) 2400 (vi) 60

(ii) 37 (vii) 2400

(iii) 2500 (viii) 37

(iv) 2400 (ix) 40

(v) 75 (x) 37

(ල. $1 \times 10 = 10$)

(b) සල්ගස යට සල්මල් (ල. 02)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2017 | 06 ශ්‍රේණිය
Final Term Test – 2017 | Grade 06

ගණිතය I | පැය දෙකයි
Mathematics I | Two Hours

## I කොටස

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


---

1) එකතු කරන්න.

```
  3 9 5
+ 2 7 4
 ______

 ======
```


2) පහත සංඛ්‍යා රේඛාව මත ලකුණු කර ඇති A හා B අගයන් ලියා දක්වන්න.




A = ............................ B = ............................

3) දිග 35 cm ක් හා පළල 17 cm ක් වූ සෘජුකෝණාස්‍රයක පරිමිතිය කොපමණද?

4) ☐ 2 මෙම සංඛ්‍යාවේ දසස්ථානයේ ඉලක්කම එකස්ථානයේ ඉලක්කම මෙන් තුන් ගුණයක් වේ නම් , හිස්තැනට සුදුසු අගය ලියන්න.


5)  මෙම ප්‍රගණන ලකුණු මගින් දැක්වෙන සංඛ්‍යාව ලියා දක්වන්න.

6) පහත දැක්වෙන ප්‍රකාශන ඥාතයක් නම් (✓) ලකුණ ද අඥාතයක් නම් (×) ලකුණද යොදන්න.

i මාසයකට ඇති දින ගණන ( )


ii සමචතුරස්‍රයක ඇති සෘජුකෝණ ගණන ( )

7) 3 235 005 මෙම සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

8) 


වෘත්තය මත පිහිටි ලක්ෂ්‍ය දෙකක් නම් කරන්න.


9) 3 : 5 = ☐ : 15 නම් හිස්තැනට සුදුසු අගය ලියන්න.

10) 


මෙම කෝණ දෙක නවින් විසින් නම් කර තිබුණේ පහත පරිදිය.

a = මහා කෝණය    b = සුළු කෝණය


මෙහි සත්‍ය අසත්‍යතාව හේතු සහිතව පැහැදිලි කරන්න.

11) 

(a) (b) (c)

මෙම රූප අතුරින් සංවෘත සරල රේඛීය තල රූපය නිරූපණය කෙරෙන අක්ෂරය කුමක්ද?

12) පැකට්ටුවක ටොෆී 50ක් ඇත. එවැනි ටොෆී පැකට් 12ක ඇති ටොෆී ගණන කීයද?

13) 


රූපයේ දැක්වෙන තරාදිය සංතුලනය වී පවතී නම් , කෙසෙල් ඇවරියේ ස්කන්ධය කොපමණද?

14) 2 × 2 × 2 × 2 × 2 = $\square^{\square}$

හිස්තැන් සඳහා සුදුසු අගයන් නිවැරදිව යොදන්න.

15) 0 ත් -3 ත් අතර පිහිටි නිඛිල සියල්ල ලියා දක්වන්න.


16) පහත සංඛ්‍යා ආසන්න දහයට වටයන්න.

i) 333 ⟶ ..............................

ii) 555 ⟶ ..............................

17) සෘජුකෝණාස්‍රාකාර ඉඩමක දිග , පළල මෙන් තුන් ගුණයකි. ඉඩමේ දිග 30m ක් නම් , ඉඩමේ වර්ගඵලය සොයන්න.

18) හිස්තැන් දෙක සඳහා සුදුසු භාග තෝරා ලියන්න.





19) සවිධි චතුස්තල දෙකක මුහුණත් දෙකක් එක මත එක පිහිටන පරිදි තබා ඇල වීමෙන් ලැබෙන ඝන වස්තුවේ,

දාර ගණන = ..................................

ශීර්ෂ ගණන = .................................. ලියන්න.

20) 6-A පන්තියේ සඳුදා දින පැමිණීම පහත දැක්වේ.




සඳුදා පැමිණි සිසුන් ගණන කොපමණද? ..................................

<u>II කොටස</u>

සැලකිය යුතුයි :

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.


---

01) a) i. 6 හි සාධක සියල්ල ලියන්න. (ල. 02)

ii. 8 හි මුල් ගුණකාර දෙක ලියන්න. (ල. 02)

b) i. 1 , 3 , 6 , ................ , ................ , ................ මෙම සංඛ්‍යා රටාවේ ඉතිරි පද තුනක් සම්පූර්ණ කරන්න. (ල. 02)

ii.



................ ................ ................ ................ (ල. 02)

ඉහත සංඛ්‍යා රටාවේ අඳුරු කල බෝලය ඉවත් කළ විට, ලැබෙන රටාවේ අඩංගු බෝල ගණන තිත් ඉරි මත ලියා දක්වන්න.

එම සංඛ්‍යා රටාවට සුදුසු නමක් ලියන්න. (ල. 01)

iii. පළමු වන ත්‍රිකෝණ සංඛ්‍යාවත් , හතරවන ඉරට්ට සංඛ්‍යාවත් එකතු කළ විට අගය කීයද? (ල. 01)

iv. එය කීවෙනි සමචතුරස්‍ර සංඛ්‍යාව ද? (ල. 01)

02)

i. වෙළඳ සැලකින් පරිප්පු 750 g ක්ද , අල 1kg 250g ක් ද , හාල්මැස්සන් 350g ක් ද මිල දී ගත් විට , මෙම භාණ්ඩ වල මුළු ස්කන්ධය කොපමණද? (ල. 03)

ii. ලී පෙට්ටියක අසුරන ලද අඹ තොගයක මුළු ස්කන්ධය කිරූ විට 37kg 500g ක් ලැබුණි . හිස් පෙට්ටියේ ස්කන්ධය 3kg 375g ක් නම්, අඹ තොගයේ ස්කන්ධය කොපමණ ද? (ල. 03)

iii. | 17 : 45 | මෙම සම්මත වේලාව පැය 12 ඔරලෝසු වේලාවෙන් දක්වන්න. (ල. 02)

iv. $1\ \ell\ 5\ m\ell$ , මිලි ලීටර වලින් ලියා දක්වන්න. (ල. 02)

v. භාජනයක ධාරිතාව $3\ell$ කි. එයට $1\ell\ 750m\ell$ ක් හා $1\ell\ 475\ m\ell$ ක ජල පරිමාවක් දැමූ විට , පිටතට ගලා යන ජල පරිමාව කොපමණද? (ල. 02)

03)

i. a) $\frac{3}{5}$ යනු $\frac{1}{5}$ ඒවා කීයද?


b) $\frac{1}{8}$ ඒවා පහක් කීයද?


c) $\frac{37}{10}$ යනු $\frac{1}{10}$ ඒවා කීයද? (ල. 03)

ii. එකතු කරන්න.

$\frac{3}{4} + \frac{1}{20} =$ (ල. 03)

iii. පහත රූපවල වටවී ඇති ප්‍රමාණය ඒකකයක් ලෙස ගත් විට , අඳුරු කර ඇති ප්‍රමාණය භාගයක් ලෙස ලියා දක්වන්න.





........................................... ........................................... (ල.02)

iv. මල්ලක බෝල x ප්‍රමාණයක් ඇත. ඒවායින් 5 ක් රතු පාටය. ඉතිරි බෝල කහ පාටය. මල්ලේ තිබෙන කහ පාට බෝල ගණන වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. (ල.02)

v.

| |
|---|
| X = 1 විට, |
| = 5 - X |
| = 5 – 5 |
| = 0 |

මෙම පිළිතුර ලබා ගත් ආකාරය නිවැරදි බව මහේෂ් පවසයි. ඔබ , ඔහුගේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.


(ල. 02)

04)


a)

i. එක් කුඩා කොටුවක වර්ගඵලය 1 $cm^2$ ලෙස ගෙන පහත එක් එක් නිර්මාණ සිදු කරන්න.

වර්ගඵලය 9 $cm^2$ ක් වූ සමචතුරස්‍රාකාර රූපයක් නිර්මාණය කරන්න. එය A ලෙස නම් කරන්න.(ල. 03)
වර්ගඵලය 14 $cm^2$ ක් වූ සෘජුකෝණාස්‍රාකාර රූපයක් නිර්මාණය කරන්න. එය B ලෙස නම් කරන්න.



b) දී ඇති රූපය අනුව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.




i. ළමයාට වයඹ දිශාවෙන් ගසක් අඳින්න.
ii. පන්සලට නිරිත දිශාවෙන් ලිඳක් අඳින්න.
iii. ළමයාට දකුණු දිශාවෙන් පිහිටන්නේ කුමක්ද? (ල. 03)


c)

i. නිමල්ට උතුරු දිශාවෙන් පන්සල පිහිටයි. නිමල්ට නැගෙනහිර දිශාවෙන් නිවස පිහිටයි. මෙම තොරතුරු රූප සටහනක දක්වන්න. (ල. 02)
ii. නිමල් නිවසට ගොස් පන්සලට ගමන් කළ යුතු නම් ඔහු ගමන් කළ යුතු දිශා පිළිවෙලින් දක්වන්න. (ල. 01)

05)

i. 16 ප්‍රගණන ලකුණු භාවිතයෙන් ලියන්න. (ල. 02)

ii.





මෙම රවුම තුළ තිබෙන රඹුටන් ගෙඩි ගණන හා අඹගෙඩි ගණන ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පළතුරු වර්ගය | ප්‍රගණන ලකුණු |
|---|---|
| අඹ | |
| රඹුටන් | |

(ල. 02)

එක්තරා සතියක පංතියේ සිසුන්ගේ පැමිණීම පහත චිත්‍ර ප්‍රස්තාරයෙන් දැක්වේ.

| | | |
|---|---|---|
| සිකුරාදා |  | 30 |
| බ්‍රහස්පතින්දා | | |
| බදාදා |  | |
| අඟහරුවාදා | | |
| සඳුදා | | 27 |

iii. සිකුරාදා පැමිණි සිසුන් ගණන 30ක් නම් ,  නිරූපණය වන සිසුන් ගණන කීයද? (ල. 02)

iv. සඳුදා පංතියට පැමිණි සිසුන් ගණන 27 කි. එය චිත්‍ර ප්‍රස්තාරයේ ඇඳ පෙන්වන්න . (ල. 03)

v. පන්තියේ මුළු සිසුන් ගණන 45 කි. බදාදා පාසලට නොපැමිණි සිසුන් ගණන කීයද? (ල. 03)

06)

i. පහත වගුවේ සඳහන් ප්‍රකාශන ඥාතයක්ද? අඥාතයක්ද ? යන්න වගුවේ සඳහන් කරන්න.

| ප්‍රකාශනය | ඥාතයක්ද? අඥාතයක්ද? |
|---|---|
| පොතක පිටු ගණන | |
| අවුරුද්දකට ඇති මාස ගණන | |
| කෙසෙල් කැනක ඇති ගෙඩි ගණන | |

(ල. 03)

ii. සුදුසු වීජීය සංකේත යොදන්න.



කූඩයේ තිබෙන බිත්තර ගණන

............................



මල්ලේ ඇති සහල් ඇට ගණන

............................

(ල. 03)

iii. සතියකට ඇති දින ගණන විචල්‍යයක් බව මනීෂ පවසයි. ඔහුගේ ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය බව හේතු සහිතව පැහැදිලි කරන්න. (ල. 02)

iv. 0.5 , 1.25 , 0.07 , 0.93 මෙම දශම සංඛ්‍යා ආරෝහණ ක්‍රමයට ලියා දක්වන්න. (ල. 02)


v. සඳලි රෙදි කඩයට ගොස් සුදු ගවුම් රෙදි 3.5m ක් ද කමිස රෙදි 3.8m ක් මිලට ගත්තාය . ඇය මිලදී ගත් මුළු රෙදි ප්‍රමාණය කොපමණද? (ල. 02)

07)

i. පහත වගන්ති වලින් අනුපාතයක් දක්වන වගන්ති තෝරා යටින් ඉරක් අඳින්න.

a) නිමල්ට වඩා නාරද ගායනයට දක්ෂ වේ.
b) දොඩම් යුෂ සෑදීමේ දී සීනි හැඳි 4 කට ලුණු හැඳි 1ක් අවශ්‍ය වේ.
c) බදාම මිශ්‍රණයක් සෑදීමේ දී සිමෙන්ති තාච්චි දෙකකට වැලි තාච්චි 12ක් අවශ්‍ය වේ.
d) නර්තන තරගයක් විනිශ්චය කිරීමේ දී සහන්ට වඩා සසිඳු දක්ෂ බව පැවසීය. (ල. 03)


ii. දී ඇති අනුපාතයට තුල්‍ය වූ අනුපාත 02ක් ලියන්න.




(ල. 02)

iii. දී ඇති සංඛ්‍යාව දර්ශක ආකාරයෙන් ලියා දක්වන්න.

3 × 3 × 3 × 3 (ල. 02)

iv. 


මෙහි දර්ශකය හා පාදය වෙන වෙනම නම් කරන්න. (ල. 02)

v. < හෝ > සංකේතවලින් නිවැරදි සංකේතය යොදා හිස්තැන් පුරවන්න.

$2^3$ ..................... $3^2$     $6^1$ ..................... $1^6$ (ල. 03)

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.